# රණවිරුවා

2021 ජනවාරි • 225 කලාපය



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.



# දැයට සවිය දෙන්නට ඓතිහාසික ඇරඹුමක්...

අතිගරු ජනාධිපතිතුමන්ගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ජාතිය ගොඩනැඟීමේ කාර්යභාරය යථාර්ථයක් බවට පත්කරමින්, රටේ කෘෂිකාර්මික අංශය නව මඟකට ගෙනයන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉකුත් ජනවාරි 07 දින "කෘෂිකාර්මික හා පශු සම්පත් බලකාය" ස්ථාපිත කරන ලදී.

යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවති මෙම නව බලකායේ සමාරම්භක අවස්ථාවට කෘෂිකාර්මික සහ පශු සම්පත් අධ්‍යක්ෂ ජෙනරාල් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් අයිපී කඳනආරච්චි ගේ ආරාධනයකට අනුව ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙසින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එක්ව්ය. එහිදී කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩව සිදුකොට ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය විදහා දක්වමින් ප්‍රදර්ශනය කර තිබූ ආදර්ශ කෘෂි ව්‍යාපෘති නිරීක්ෂණය කිරීමටද යුද්ධ හමුදාධිපතිතුමන් සහභාගි වූයේය.

ජාතිය ගොඩනැඟීමේ කාර්යභාරය යටතේ නාගරික අලංකරණය, පැළ රෝපණය කිරීම, වැව් ප්‍රතිසංස්කරණය, ව්‍යායාම මංතීරු ඉදිකිරීම, පොදු පහසුකම් සංවර්ධනය, මාර්ග ඉදිකිරීම් ඇතුළු විවිධ ප්‍රතිසංස්කරණ කටයුතු රැසක් සඳහා හමුදාවේ හැකියාවන් දැනටමත් විදහා දක්වා ඇත. එම කටයුතු තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් මෙලෙස ජාතිය ගොඩනැගීමේ කාර්යභාරයට නව බලකායක් ස්ථාපිත කෙරුණේ යුද්ධ හමුදාධිපතිතුමන්ගේ මාහැඟි සංකල්පයක් අරුත් ගන්වමිනි.

නව යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය ස්ථාපිත කිරීම තුළින් කෘෂි සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම, ශීතාගාර පහසුකම් ඇති කිරීම, මිරිදිය මත්ස්‍ය ව්‍යාපාරය දියුණු කිරීම, ත්‍රිවිධ හමුදා කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මූලිකත්වයෙන් ගොවිජන අංශ තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා උපරිම සහය ලබාදීමට අපේක්ෂා කෙරේ.

යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදාව සතු භූමි ප්‍රමාණයන් ප්‍රයෝජනයට ගනිමින් නවීන තාක්ෂණය හා දැනුම උපයෝගී කරගනිමින් කෘෂි හා සත්ත්ව නිෂ්පාදන ඉහළ නැංවීමට කන්දකාඩු, මැණික්ෆාම්, වෙල්ලම්කුලම්, ගල්කන්ද, පලටුපාන, ආඩියාපුලියන්කුලම්, බලල්ල සහ නිරාවිය යන ප්‍රදේශයන්හි යුද්ධ හමුදා ගොවිපළවල් ස්ථාපිත කර ඇත. මේ වනවිට යුද්ධ හමුදා හටපිරිස් "තුරු මිතුරු නව රටක්" ව්‍යාපෘතිය යටතේ සහල් නිෂ්පාදන, අක්කර 1,000 කින් යුත් පොල් වගාව, අක්කර 500 කින් යුත් අඹ වගාව, අක්කර 2000 ක කජු වගාව, අක්කර 200 කින් යුත් මිරිස් වගාව, ගව පාලනය (ජීවානුහරිත කල්කිරි, යෝගට්, මුදවාපු කිරි), ලේයර් සතුන් 100,000 කින් යුතු බිත්තර නිෂ්පාදන, දේශීය කැළෑ සලාක මළ් නිෂ්පාදනය, ලුණු නිෂ්පාදනය, තක්කාලි සෝස් නිෂ්පාදනය, කොම්පෝස්ට් නිෂ්පාදනය සහ කහ පැළ 100,000 වගා කිරීම ආදී ව්‍යාපෘතීන් රැසක් යුද්ධ හමුදා ගොවිපළවල් කේන්ද්‍ර කරගනිමින් ආරම්භ කර ඇත.


Primary Land Preparation Equipment
Browns









# නව වසරේ වැඩ ඇරඹුම සුබ මොහොතින්...



එළැඹි 2021 නව වසරේ රාජකාරී ඇරඹීම නිමිත්තෙන් සංවිධානය කෙරුණු උත්සව දෙකක් යුද්ධ හමුදා මූලස්ථානයේදී හා ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේදී පැවැත්වූයේ ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙනි. එහිදී මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ පැවති උත්සවයට සුවිශේෂිත්වයක් එක් කරමින් යුද්ධ හමුදාධිපතිතුමා අතින් එහි සේවය කරන සිවිල් සාමාජිකයින්ට නව වසර වෙනුවෙන් ත්‍යාග පාර්සල් ද පිරිනැමිණ.





# සන්නද්ධ බුද්ධි බලකා පුහුණු පාසලට නව ගොඩනැගිලි සංකීර්ණයක්...



කරන්දෙණියේ පිහිටි සන්නද්ධ බුද්ධි බලකා රෙජිමේන්තු මූලස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කරමින් බුද්ධි පුහුණු පාසල් පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ ප්‍රධාන ගොඩනැගිල්ල විවෘත කිරීම පසුගිය ජනවාරි 15 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් විවෘත කෙරිණි.

මෙම අවස්ථාවට සන්නද්ධ බුද්ධි බලකායේ කර්නල් සේනාධිනායක මේජර් ජෙනරාල් ඒඑස් හේවාවිතාරණ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී අයිජී, සන්නද්ධ බුද්ධි බලකා පුහුණු පාසලේ සේනාධිනායක කර්නල් ටීටීපී සිරිවර්ධන ආර්එස්පී පීඑස්සී එල්එස්සී ඇතුළු බලකායේ නිලධාරීන් හා සෙසුනිලයින් විශාල පිරිසක් එක්වූහ.



# සංඥා බලකායේ "නිහඬ වීරයන්" ග්‍රන්ථය දොරට වඩී...

දශක අටකට ආසන්න ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බලකාය පිළිබඳ ලියවුණු "නිහඬ වීරයන්" ග්‍රන්ථය ඉකුත් ජනවාරි 06 වන දින සන්ධ්‍යාවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී එළිදැක්විණ. එහිදී ග්‍රන්ථයේ මංගල පිටපත ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත පිළිගැන්විණ. මෙම ග්‍රන්ථය දොරට වැඩි අවස්ථාවේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය මෙන්ම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපායමාර්ගික අධ්‍යයන අංශ ප්‍රධානී ආචාර්ය හරීන්ද්‍ර විදානගේ මහතා සවිස්තරාත්මක සමාලෝචනයක්ද සිදුකළේය. මෙම ග්‍රන්ථය දොරට වැඩි අවස්ථාවෙන් අනතුරුව යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා සංඥා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීඑස්පීඑන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී විසින් එහි පිටපතක් ජනාධිපති ලේකම් කාර්යාලයේදී සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් වෙතද පිළිගන්වන ලදී.








# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රියදුරු බලපත්‍ර මුද්‍රණය අරඹයි...

2021 ජනවාරි 01 වන දින පටන් රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ ක්‍රියාවලිය යුද්ධ හමුදාව විසින් අරඹනු ලැබීය. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් අතර ඒ සම්බන්ධයෙන් වූ අවබෝධතා ගිවිසුමට පසුගියදා අත්සන් තැබිණ.

මීට පෙර පැවැති ජාතික රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය ඉහළ නංවමින් දූෂණය, විෂමතා සහ අක්‍රමිකතාවයන්ගෙන් තොරව ඒවා මුද්‍රණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකා තොරතුරු විසඳුම් මධ්‍යස්ථානය මෙම රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ ක්‍රියාවලිය සිදුකරන අතර එහි සමාරම්භය සනිටුහන් කරමින් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ පැරණි රියදුරු බලපත්‍රය වෙනුවට නව රියදුරු බලපත්‍රයක් සංකේතාත්මකව එතුමන් වෙත ප්‍රදානය කෙරිණි. රියදුරු බලපත්‍ර ලබාගැනීම සඳහා පැමිණෙන සියගණනක් මහජනතාවට දූෂණයෙන් තොර කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින් අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් මත මෙම ක්‍රියාවලිය යුද්ධ හමුදාවට භාරදෙන ලදී.











# මිරිදිය පවන විවෘත කෙරේ....

ශ්‍රී ලංකා සංඥා බලකායේ හටපිරිස් විසින් මින්නේරිය වැව ආසන්නයේ මනරම් භූමිභාගයක ඉදිකළ "මිරිදිය පවන" නිවාඩු නිකේතනය ඉකුත් ජනවාරි 09 වන දින විවෘත කරන ලදී.

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා සංඥා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීපීඑන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.








# මාතලේ නගර මධ්‍යයට හොකී ස්මාරකයක්...

ඓතිහාසික මාතලේ පුරවරයේ හොකී ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා දායකත්වය දැක්වූ සියලුදෙනා සිහිපත් කරමින් එහි නගර මධ්‍යයේ ඉදිකෙරුණු විශේෂ "හොකී ස්මාරකය" පසුගිය ජනවාරි 09 වන දින විවෘත කෙරිණ.


මෙම ආකර්ෂණීය ස්මාරකය ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශ්‍රාමික හොකී සංගමය මුලිකත්වය ගෙන කටයුතු කළ අතර, එම සංගමයේ ආරාධනයකට අනුව ස්මාරකය නිරාවරණය කිරීමේ උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.



# දීඝවාපිය ස්ථූපයේ ප්‍රතිසංස්කරණ කටයුතු සොයාබැලේ...

ඓතිහාසික දීඝවාපිය ස්ථූපයේ ප්‍රතිසංස්කරණ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ආරක්ෂක ලේකම් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න, මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජගත් අල්විස්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සිවිල් බලධාරීන් පිරිසක් පසුගිය ජනවාරි 26 වන දින එහි නිරීක්ෂණ චාරිකාවක නිරතවූහ.

දීඝවාපී ස්ථූප ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා දිනකට අවශ්‍ය ස්ථූප ගඩොල් 30,000 ක පමණ ප්‍රමාණය යුද්ධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් නිෂ්පාදනය කරන අතර, ස්ථූපය ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දායක වීමට කැමති බැතිමතුන් හට මෙම උදාර අරමුණ සඳහා මූල්‍ය දායකත්වය ලබාදීම සඳහා බැංකු ගිණුමක්ද ආරම්භ කර ඇත. වසර තුනක කාලයක් තුළ මෙම මහා ස්ථූපයේ ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමට අපේක්ෂිතය.







# පින්බිමක එසවෙන හිත් නිවන මුදුනත...





යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය, නාවික හමුදාව, ගුවන් හමුදාව සහ පොලිසියේ සහයෝගීතාවයේ ප්‍රතිඵලයක් ලෙසින් කන්කසන්තුරේ ඓතිහාසික තිස්ස රජමහා විහාරයේ ඉදිකෙරෙන නව ස්ථූපයක් සහ ආරාමයක් සඳහා මුල්ගල් තැබීම ඉකුත් ජනවාරි 30 වන දින ආගමික වතාවත් මධ්‍යයේ සිදුකෙරිණ.

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ආරාධනාවකට අනුව මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය. මීට ශතවර්ෂ ගණනාවකට පෙර දේවානම්පියතිස්ස රජ සමයේ දී (ක්‍රි.පූ 250-210) සංඝමිත්තා තෙරණින් වහන්සේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවාගෙන අනුරාධපුරය දක්වා යන අතරතුර විවේක ගැනීමට මෙම විහාරස්ථානයට වැඩම කරනු ලැබූ බව ඉතිහාසයේ සඳහන් වේ.

අඩි 100 ක උසකින් යුතු මෙම ස්ථූපයේ ඉදිකිරීම් කටයුතු මොරටුව විශ්වවිද්‍යාලයේ ගෘහ නිර්මාණ ශිල්ප පීඨයේ සිසුන් විසින් සැලසුම් කර ඇති අතර, එම විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සමිතා මානවඩු සහ මහාචාර්ය නිමල් ද සිල්වා යන මහත්ම මහත්මීන් විසින් ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් වැඩිදුර තාක්ෂණික විශේෂඥ දැනුම ලබාදෙති. මෙම චෛත්‍යයේ සහ ආරාමයේ ඉදිකිරීම් කටයුතු යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත 5 වන ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස් විසින් සිදුකරනු ලබති.



# හදිසි නිරෝධායන ප්‍රතිකාරවලට හමුදාවේ සූදානම පිරික්සයි...

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පසුගිය ජනවාරි 30 වන දින යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයෙහි සිදුකළ සංචාරය අතරතුර යුද්ධ හමුදාව විසින් වාසවිලාන් ප්‍රදේශයේ රජයට අයත් ගොඩනැගිලි සමූහයක් අළුත්වැඩියා කොට ස්ථාපිත කරන ලද නිරෝධායන මධ්‍යස්ථානයෙහි නිරීක්ෂණ සංචාරයක නිරතවිය.

මෙම නිරෝධායන මධ්‍යස්ථානය පුද්ගලයින් 500 - 1000 ත් අතර ප්‍රමාණයක් එකවර නිරෝධායනය කිරීමේ හැකියාවෙන් සමන්විත වන අතර, හදිසි අවස්ථාවකදී ප්‍රයෝජනයට ගනු පිණිස සියලු පහසුකම් සමගින් එය ගොඩනගා ඇත. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් පරිදි 52 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ අධීක්ෂණය යටතේ එම සේනාංකයට අයත් භටපිරිස් විසින් අළුත්වැඩියා කරන ලද මෙම මධ්‍යස්ථානය රෙදිසෝදන යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, සන්නිවේදන උපකරණ, උසස් මට්ටමේ වැසිකිළි, කැසිකිළි ආදියෙන් සමන්විත වේ.



# ඓතිහාසික ඇරඹුමක්...

රෙජිමේන්තු අධිපතිවරුන් සහ රෙජිමේන්තු කර්නල් සේනාවිධායකවරුන් වෙනුවෙන් ප්‍රථම වරට නිර්මාණය කරන ලද යෂ්ටි ප්‍රදානය කිරීම ඉකුත් ජනවාරි 29 වන දින ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ.



යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයකට අනුව සිදුකෙරුණු මෙම යෂ්ටි ප්‍රදානය තුළින් එම යෂ්ටිය හිමි නිලධාරියා සතු අධිකාරිත්වය සහ බලය නිරූපණය වේ. දැවමය නිමාවකින් යුතු යෂ්ටි තුළින් උසස් නිලධාරියෙකු සතු පිළිගත් හා කැපී පෙනෙන සේවාවක ඇති වැදගත්කම හා අභිමානය පිළිබිඹු කෙරේ. ඔවුන්ගේ උසස්වීම් වෙනුවෙන් ගෞරවාචාර දැක්වීමේ අරමුණින් චාරිත්‍රානුකූලව මෙම යෂ්ටි ප්‍රදානය සිදුකරනු ලැබිණ.







# කොවිඩ් පාලනයට දිස්ත්‍රික් සම්බන්ධීකාරක නිලධාරීන්...

කොවිඩ්-19 වෛරසයේ පාලන කටයුතු ශක්තිමත් කිරීම සඳහා දිවයින පුරා සියලුම පරිපාලන දිස්ත්‍රික් ආවරණය වන පරිදි යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 25 දෙනෙකු දිස්ත්‍රික් සම්බන්ධීකාරක නිලධාරීන් ලෙස පත් කිරීම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ නිර්දේශය මත ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සිදුකරන ලදී. එසේ පත්කරනු ලැබූ යුද්ධ හමුදා නිලධාරීන් වෙත අදාළ පත්වීම් ලිපි භාරදීම පසුගිය දෙසැම්බර් 31 වන දින යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුරතින් සිදුකෙරිණ.













# යුද්ධ හමුදාධිපති ආහාර සැපයුම්කරුවන් හමුවේ...

යුද්ධ හමුදාවට නැවුම් ආහාර (අමු සලාක) සහ වියළි සලාක සපයන සැපයුම්කරුවන් සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අතර විශේෂ සාකච්ඡාවක් යුද්ධ හමුදා සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් පසුගිය ජනවාරි 12 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි.


කොවිඩ්-19 වෛරසය ව්‍යාප්තියත් සමඟ පැනවූ හදිසි ඇඳිරිනීතිය සහ ප්‍රදේශ හුදෙකලා කිරීම යන අභියෝග මධ්‍යයේ යුද්ධ හමුදාවට මෙන්ම දිවයින පුරා පිහිටි යුද්ධ හමුදාව විසින් පාලනය කරනු ලබන නිරෝධායන මධ්‍යස්ථාන වෙත අඛණ්ඩව නැවුම් ආහාර (අමු සලාක) සහ වියළි සලාක සැපයීම පිළිබඳව එහිදී යුද්ධ හමුදාධිපති සැපයුම්කරුවන්ට සිය ස්තූතිය පුද කළේය.

මෙම විශේෂ සාකච්ඡාව සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්ආර්ඩබ්ලිව්ඩබ්ලිව්එච්ජේබී වනිගසේකර යූඑස්පී, යුද්ධ හමුදා සේවා බලකායේ සියලුම අණදෙන නිලධාරීන් සහ ස්වාධීන සැපයුම් ගබඩාවේ සේනාවිධායක ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.



# ඇඟලුම් කර්මාන්තයේ ප්‍රමුඛයන්ගෙන් යුද්ධ හමුදාවට පැසසුම්...

පසුගිය වසරේ ඇඟලුම් කර්මාන්තයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට බාධාවක් එල්ල කරමින් එම ක්ෂේත්‍රයේ සේවකයින් අතර කොවිඩ්-19 වෛරසය සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. එහි දෙවන රැල්ල පාලනය කරගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් මත ක්‍රියාත්මක වූ කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම පිළිබඳ කාර්ය සාධක බලකායට ස්තූතිය පුද කිරීම වෙනුවෙන් ඒකාබද්ධ ඇඟලුම් සංගමයේ සභාපති ඒ. සුකුමාරන් මහතා ඇතුළු ප්‍රමුඛ පෙළේ නියෝජිත පිරිසක් ඉකුත් ජනවාරි 04 වන දින සත්ධාතාවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවූහ.




# ප්‍රථම කොවිඩ් 19 එන්නත් තොගය දිවයිනට...



ඉන්දීය රජය විසින් ප්‍රදානය කළ කොවිඩ් මර්ධන එන්නත් පළමු තොගය ඉන්දියානු මහකොමසාරිස් ගෝපාල් බග්ලේ මහතා විසින් පසුගිය ජනවාරි 28 වන දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත නිල වශයෙන් භාරදෙනු ලැබීය.

කොවිඩ් වෛරසය පැතිරීම පාලනය කිරීම, ආසාදිතයින්ගේ ආශ්‍රිතයින් සහ වෛරසයේ අවධානමට ලක්විය හැකි පිරිස් නිරෝධායනය කිරීම සහ ආසාදිතයින්ට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් ඉදිරිපෙළ ක්‍රියාකරන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ප්‍රමුඛ ත්‍රිවිධ හමුදාව, පොලිසිය ඇතුළු ආරක්ෂක අංශ සාමාජිකයින් සහ සෞඛ්‍ය සේවකයින් වෙත එම එන්නත පළමුව ලබාදීමට සැලසුම් කර ඇත.

# කොවිඩ් මැඩලීමට සහාය...




කොවිඩ්-19 වෛරසය පාලනය කිරීම සඳහා ත්‍රිවිධ හමුදා හටපිරිස් සිදුකරනු ලබන අසමසම කාර්යභාරය අගයමින්, IME Korea සහ SD Biosensors යන සමාගම් ඔවුන්ගේ මෙරට පාර්ශ්වකරුවන් හරහා මුහුණු ආවරණ සහ ප්‍රතිදේහජනක පරීක්ෂණ කට්ටල තොගයක් පරිත්‍යාග කිරීම පසුගිය ජනවාරි 18 වන දින සිදුකරන ලදී.

කොරියාවේ සෝල් නුවර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, එම සමාගම් දෙක ඒකාබද්ධව සිදුකළ මෙම පරිත්‍යාගයට රුපියල් මිලියන 25 ක් පමණ වටිනා මුහුණු ආවරණ 8,000 ක් සහ ප්‍රතිදේහජනක පරීක්ෂණ කට්ටල 10,000 ක් ඇතුළත්ය. යුද්ධ හමුදාධිපතිතුමා වෙත යුද්ධ හමුදා මූලස්ථානයේදී අදාළ පරිත්‍යාග භාරදුන් අවස්ථාවට එම කොරියානු සමාගම්වල දේශීය හවුල්කරුවන් වන Seek Energy Private Limited හි අධ්‍යක්ෂ වරික් සෙඕ මහතා (Warrick SEO), එම පුද්ගලික සමාගමේ මෙරට ප්‍රධානී රුමේෂ් උබයසිරි මහතා සහ එම සමාගමේ සහකාර කළමනාකරු උදාරා සේනානායක යන මහත්වරු සහභාගී වූහ.

# රුවන්ඩා නියෝජිතයින් යුද්ධ හමුදාධිපති හමුවේ...



උතුරු මැද පළාත ඇතුළු දිවයිනේ ප්‍රදේශ රැසක බඩඉරිඟු වගාව ආක්‍රමණය කර ඇති සේනා දළඹුවන් පාලනය කිරීම සඳහා විද්‍යාත්මක විශේෂඥ දැනුමක් ලබාගැනීමේ අරමුණින් රුවන්ඩාවේ විශේෂ නියෝජිත පිරිසක් මෙරටට ගෙන්වන ලදී. දෙදිනක් පුරා ඔවුන් යුද්ධ හමුදාව සමඟ එක්ව ඒ පිළිබඳ කරුණු විමර්ශනය කිරීමෙන් අනතුරුව පසුගියදා යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය.

# සුහද හමුවක මතක සටහන්...



ශ්‍රී ලංකා චීන මහජන සමූහාණ්ඩු තානාපති කාර්යාලයේ ආරක්‍ෂක උපදේශක ජ්‍යෙෂ්ඨ කර්නල් වන් ජොන්ග් සහ නියෝජ්‍ය ආරක්‍ෂක අණදෙන නිලධාරී කර්නල් චැං ක්වාන්ජින් යන නිලධාරීන් පසුගිය ජනවාරි 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. එහිදී දෙරට අතර පවත්නා යුද සබඳතා ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත චීන හමුදාව විසින් ලබාදී ඇති පුහුණු අභ්‍යාසයන් තවදුරටත් පුළුල් කරමින් අන්‍යෝන්‍ය අවබෝධය සහ මිත්‍රශීලීත්වය වැඩිදියුණු කරගැනීම පිළිබඳව වැදගත් කරුණු රැසක් දෙපාර්ශ්වය අතර සාකච්ඡා කෙරුණි.



ශ්‍රී ලංකාවේ බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක කොමඩෝරු මොහොමඩ් ෂෆියුල් බාරි (Commodore Mohamed Shafiul Bari) ඉකුත් ජනවාරි 13 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. මෙම සුහද හමුවේදී, දෙරට හමුදාවන් අතර පවත්නා ද්විපාර්ශ්වික සබඳතා කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කළ අතර, විශේෂයෙන්ම බංගලාදේශ හමුදාව විසින් ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වෙනුවෙන් දැනටමත් ලබා දී ඇති පුහුණු වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාව පිළිබඳවද සාකච්ඡා කෙරිණි.



ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්‍ෂක උපදේශක ලුතිනන් කර්නල් පුනීත් සුෂිල් ඉකුත් ජනවාරි 06 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. මෙම සුහද හමුවේදී දෙපාර්ශ්වය අතර පවත්නා සහයෝගීතාවය සහ සුහද සම්බන්ධතා පිළිබඳව සහකාර ආරක්‍ෂක උපදේශක යුද්ධ හමුදාධිපතිතුමන්ට සිය කෘතඥතාව පළ කරමින් උදාවූ නව වසර වෙනුවෙන් සිය සුභාශිංසන ද පිරිනැමීය.





# සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට නව ජවයක්...

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නව අධ්‍යක්ෂ ජෙනරාල් ධුරයට පත්වූ මේජර් ජෙනරාල් (විශ්‍රාමික) නන්දන සේනාධීර පසුගිය ජනවාරි 21 වන දින සිය ධුරයේ රාජකාරි භාරගනු ලැබීය.

නව ධුරයේ රාජකාරි ආරම්භ කිරීමේ සමාරම්භක උත්සව අවස්ථාව සඳහා විශේෂ ආරාධිත අමුත්තන් ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් (විශ්‍රාමික) දයා රත්නායක, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මිය ඇතුළු පිරිසක්ද එක්වූහ.

# අභිමත් ගමනකට උණුසුම් සුබපැතුම්...



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී 2021 නව වසරේ පළමු දින වැඩකටයුතු ආරම්භ කිරීම සංකේතවත් කරමින් උසස්වීම් ලැබූ බ්‍රිගේඩියර්වරුන් පස්දෙනෙකුට යුද්ධ හමුදා මූලස්ථානයේදී මේජර් ජෙනරාල් නිලයේ ලාංඡන පැළඳවීය.

ඒ අනුව, උසස්වීම් ලැබූයේ මේජර් ජෙනරාල් එම්පී ලමාහේවා යූඑස්පී, මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී දිසානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී, මේජර් ජෙනරාල් ඩීජේ හේවගේ ආර්එස්පී, මේජර් ජෙනරාල් එම්පී කරුණාරත්න අයිජී සහ මේජර් ජෙනරාල් පීඑම්එල් චන්ද්‍රසිරි ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ යන නිලධාරීන්ය.



# නැවුම් දිනක සුහද හමුවක්





2021 නව වසර උදාව නිමිත්තෙන් යුද්ධ හමුදා සේවා වනිතා ගරු සභාපතිනි සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම ඒකක සියලු නිලයින් සඳහා තේ පැන් සංග්‍රහයක් පැවැත්විණ. එහිදී එම ඒකකයේ සේවය කරනු ලබන රණවිරුවන් 135 දෙනෙකුගේ අධ්‍යාපනය හදාරන දරුවන්ට පාසල් සපත්තු මිලදීගැනීම සඳහා වවුචර්පත් පිරිනැමීම ද සිවිල් සේවකයින් සඳහා රුපියල් 3000.00 ක වටිනාකමකින් යුත් වියළි සලාක ලබාදීමද සභාපතිනියගේ සුරතින් සිදුවූවාය.

එම අවස්ථාවට සේවා වනිතා ඒකකයේ කර්නල් (සම්බන්ධීකරණ) කර්නල් ටීඑස් බාලසූරිය ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින්, සිවිල් සේවකයින් ඇතුළු විශාල පිරිසක් එක්වූහ.

# ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව...



ඉංජිනේරු බලකායට අයත් ක්‍රියාන්විත හේතූන් මත ආබාධිත තත්වයට පත්වූ නිලධාරීන් සහ සෙසුනිලයින් 09 දෙනෙකු සඳහා කෘත්‍රිම අත්පා සහ රෝදපුටු බෙදාදීම සහ ක්‍රියාන්විත හේතූන් මත මියගිය සෙනිත්ගේ දරුවන් 15 දෙනෙකුගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම වෙනුවෙන් පාසල් පොත් බෙදාදීමේ උත්සවයක් ඉකුත් ජනවාරි 20 වන දින මත්තෙගොඩ කඳවුරේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ මගපෙන්වීම යටතේ පරිත්‍යාගශීලීන් විසින් ලබාදුන් මෙම ආධාර එහිදී ලබාදෙන ලදී. එම අවස්ථාව සඳහා ගරු සභාපතිනිය රමනා පීරිස් ඇතුළු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් සහ ඉංජිනේරු බලකා කර්නල් සේනාවිධායක ඇතුළු නිලධාරීන් කිහිපදෙනෙකු සහභාගි වූහ.



# සංඥා බලකා සේවා වනිතා ශාඛාව...



ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ලෙස රාජකාරි කළ රමණී දෙමටන්පිටිය මහත්මිය සිය රාජකාරිය නව සභාපතිනිය වන සජීවනී පීරිස් මහත්මිය වෙත භාරදීම ඉකුත් ජනවාරි 31 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සිදුවිය. තවද එම සේවා වනිතා ශාඛාවේ මාසික රැස්වීමද එදින පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක් සහභාගි වූහ.



# පාබල හමුදා සේවා වනිතා ශාඛාව...



පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි අනුජා ජයවීර මහත්මියගේ උපදෙස් පරිදි එම සේවා වනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වයෙන් 8 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් දෙදරු පියෙකු වන සෙ/311827 බනි 11 අබේසිංහ ඒඑම්කේ යන බලලත් නිලධාරී වෙත නව නිවසක් ඉදිකර භාරදීම පසුගියදා සුබ මොහොතින් පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ සුරතින් සිදුකෙරිණි. මෙම අවස්ථාව සඳහා එම රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක, එම සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන් ඇතුළු පිරිසක් සහභාගී වූහ. පාබල හමුදා සේවා වනිතා ඒකකයේ මූල්‍ය අනුග්‍රහයෙන් ඉදිවුණු මෙම නිවස සඳහා 8 වන පාබල හමුදා ඒකකය විසින් ශ්‍රම දායකත්වය ලබාදෙන ලදී.



# යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...



සර්පයෙකු දෂ්ට කිරීමෙන් දකුණු අත, කකුල අප්‍රාණික වීම සහ ඇස් සම්පූර්ණයෙන්ම නොපෙනීම හේතුවෙන් පූර්ණ ආබාධිත තත්වයට පත් 1 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තු තූර්ය වාදක කණ්ඩායමේ රාජකාරියේ නියුතු සෙ/829063 ලා/කෝ පියදාස එල්ඩබ්ලිව්සීපී යන කොනොනිගේ නිවස එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ මූල්‍ය ආධාර මත ප්‍රතිසංස්කරණය කර පසුගියදා නත් කොනොනි හට ලබාදෙන ලදී.

තවද, මාලි රාජ්‍යයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව පාදයක් අහිමිව පූර්ණ ආබාධිත තත්වයට පත් 4 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවට අයත් සෙ/827678 කෝප්‍රල් ඒකනායක ඒජීපී යන කොනොනිගේ පහසුව සඳහා එම සේවා වනිතා ශාඛාවේ මූල්‍ය ආධාර මත නිවසේ යාබද නානකාමරයක් සකස් කර නිවස ප්‍රතිසංස්කරණය කර පසුගියදා භාරදෙන ලදී. මෙම අවස්ථාවට යාන්ත්‍රික පාබල රෙජිමේන්තු අධිපති, ජ්‍යේෂ්ඨ නිලධාරීන්, එම සේවාවනිතා ශාඛාවේ සභාපතිනි නෙළුම් වඩුගේ මහත්මිය ඇතුළු සාමාජිකාවන් රැසක් සහභාගි වූහ.



# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...





මුහමාලේ ප්‍රදේශයේ ක්‍රියාත්මක රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදීන්ගේ පුද්ගලනාශක බිම් බෝම්බයකට හසුවීම හේතුවෙන් දණහිසට පහළින් දෙපා අහිමිව දැනට පූර්ණ ආබාධිත සෙබළෙකු වශයෙන් අභිමංසල 111 හි නේවාසික ප්‍රතිකාර ලබන කුරුණෑගල, රිදීගම පදිංචි සෙ/518227 කෝප්‍රල් විජේසිංහ එම්එම්ජී යන කොනොති ගේ නිවසෙහි පැවති ජල ගැටළුවකට පසුගියදා විසඳුම් ලැබිණ. ඒ අනුව එම ජල ගැටළුවට පිළියමක් වශයෙන් විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ මඟපෙන්වීම මත ජ්‍යෙෂ්ඨ සාමාජිකා ඉරන්ති දිල්රුක්ෂි මහත්මිය සහ කර්නල් පීඑස්එස් සංජීව ආර්එස්පී පීඑස්සී ගේ මිතුරු කැල විසින් සිදුකරන ලද ධන පරිත්‍යාගයෙන් රුපියල් 170,000.00 ක මුදලක් වැයකර නළ ළිඳක් ඉදිකරදෙන ලදී.

# ඉංජිනේරු සේවා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...



අත්තිඩිය මිහිඳු සෙත් මැදුරෙහි ප්‍රතිකාර ලබන රණවිරුවන් හට අවශ්‍යතාවක්ව පැවති ආහාර ගනු ලබන මේස සඳහා වන ඇතිරිලි 40 ක් සහ අත්පිස්නා 80 ක් ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා සභාපතිනියගේ මඟපෙන්වීම මත 14(සේවා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජනවාරි 20 වන දින මිහිඳු සෙත්මැදුර වෙත භාරදෙන ලදී.



> මාස 18 එනම් දරුවාට අවුරුදු එකහමාර වනවිට වැඩි වශයෙන් තනි වචන හා අභිනයන් භාවිතා කරමින් දරුවා සන්නිවේදනය කරයි. අම්මා, තාත්තා, ආතා, බච්චා වැනි සුරතල් වචන මගින් දරුවා සන්නිවේදනය කරන්නට හුරුවන්නේ මේ කාලයේය.

# ඔබභෝර්ත දරුවා සහ කථාව

බොහොමයක් පුංචි දරුවන් කථන හා භාෂා වර්ධනයේ තාවකාලික ප්‍රමාදයන් පෙන්නුම් කරයි. කාලයත් සමග බොහෝ දරුවන්ගේ කතාව ස්වභාවිකවම ඔවුන් නිවැරදි කරගනී. එහෙත් තවත් දරුවන් පිරිසක් මෙම ප්‍රමාදය දීර්ඝකාලීනව රැගෙන යයි. ඔවුන්ට තම කථන භාෂාව සහ සන්නිවේදනය පිළිබඳ ගැටළු මතුවේ. කථන ආබාධයකින් පෙළෙන දරුවකුට කටහඬ, කටහඬේ අනුනාදය සහ චතුරතාව පිළිබඳ ගැටළු මතුවේ.

කථන ආබාධ මොනවාද? කථන හා භාෂා ආබාධයන් ඇතිවීමට හේතු මොනවාද? දරුවා තුළ පවතින කථන ආබාධ හඳුනාගන්නේ කෙසේද ? දෙමව්පියන් විදිහට මොනවද දරුවා වෙනුවෙන් අපට කළ හැක්කේ? යන්න පිළිබඳව අපි අවධානය යොමු කරමු.

## කථන ශබ්දයන්හි ආබාධ

කථන ශබ්දයන්හි ආබාධයකින් පෙළෙන දරුවකුට කථන ශබ්ද සියල්ලම එකතු කරමින් වචන පැවසිය නොහැක. මේ හේතුවෙන් මෙවන් දරුවන්ගේ කතාව තේරුම් ගැනීමට අපහසුය. එදිනෙදා කාර්යයන් වලදී දරුවා පවසන දෙය තම මවට පියාට පවා නොතේරෙන තත්ත්වයක් ඇතිවේ. බොහෝ දරුවන්ගේ කථන ශබ්ද ආබාධයන්ට හේතුව සොයාගැනීමට නොහැකි වීමෙන් පවුලේ සාමාජිකයින් වඩාත් අසරණ වේ. සමහර දරුවන් තුළ උපතට ලැබෙන විදලිත තොල සහ තල්ල(cleft lip and palate), දත්වල ප්‍රශ්න, කණ ඇසීමේ අපහසුතා, මුඛය ආශ්‍රිත මාංශ පේශීන් චලනය කිරීමේ අපහසුතා නිසා කථන ශබ්ද නිසිලෙස පිටකිරීමට දරුවන්ට අපහසු වේ.

මාස 5,6 සහ 7 වන විට දරුවකු ආආආ, ඌඌඌ, ඊඊඊ, වැනි ස්වර ශබ්ද හා ප,බ,ම වැනි ව්‍යාංජන ශබ්ද පිටකරමින් දීපපප, මමම, බබබ, පමපම, බමබම, පබමපබමබපමමපබ, ලෙස ශබ්ද සමග සෙල්ලම් කරමින් අදහස් ප්‍රකාශ කරන්නට පෙළඹේ. මේ කාලය වනවිට දරුවා තම මුඛය ආශ්‍රිත ක්‍රියාකාරකම් මගින් සතුටුවන අතර, කෙළ පිඹීම වැනි ක්‍රියාවන් සේම විවිධ ශබ්ද පිටකිරීමෙන්ද සතුටු වේ. මාස 8,9 හෝ 10 වන විටත් දරුවා මෙසේ ශබ්ද සමග සෙල්ලම් නොකරනවිට එනම් දරුවා ව්‍යාංජනාක්ෂර ශබ්ද භාවිතා නොකරන විට දෙමාපියන් හෝ පවුලේ අයවළුන් ඒ පිළිබඳ වඩාත් සැලකිලිමත් වියයුතුය.

තවද, මාස 18 දී, එනම් දරුවාට අවුරුදු එකහමාර වනවිට වැඩි වශයෙන් තනි වචන හා අභිනයන් භාවිතා කරමින් දරුවා සන්නිවේදනය කරයි. අම්මා, තාත්තා, ආතා, බච්චා වැනි සුරතල් වචන මගින් දරුවා සන්නිවේදනය කරන්නට හුරුවන්නේ මේ කාලයේය. නමුත් එසේ තනි වචන හෝ ශබ්ද උපයෝගී කරගනිමින් දරුවා සන්නිවේදනය නොකරන විට ඔබ ඔබේ දරුවා පිළිබඳ වඩාත් සැලකිලිමත් වියයුතුය.

වයස අවුරුදු 2 වන විට වචන 2ක් එකතු කරමින් දරුවා සරල වාක්‍ය භාවිතයෙන් සන්නිවේදනය කරයි. ජෝ දෙන්න, තාත්තා ගියා, අම්මා ආදෙයි, හබුන් කෑවා, වැනි වාක්‍ය දරුවා භාවිතා කරන්නේ මේ කාලයේය. වයස අවුරුදු 3 වන විට දරුවා වචන 3,4 එකතු කරමින් වාක්‍ය සාදමින් සන්නිවේදනය කරයි. දී තාත්තා, ඇඩට ගියා, අම්මා බත් දුන්නා, මේ පුංචි නමුත් සරල භාෂාව බොහෝ දෙනෙකුට තේරුම්ගත හැකිය. නමුත් එය එසේ නොවන විට ඔබ ඔබේ දරුවාගේ කථන ශබ්ද පිටකිරීම පිළිබඳ වඩාත් සැලකිලිමත්විය යුතුය. වයස අවුරුදු 4 වන විට දරුවා පුංචි සිද්ධි එකතු කරමින් කතාවක් ගොඩනගමින් කතාකළ යුතුය. මල්ලි වැටුණා, තුවාල වුණා, මල්ලි හයියෙන් ඇඩුවා ආදී වශයෙනි.

නමුත් ඔබේ දරුවා මෙවන් පුංචි සරල කථන ශබ්ද උපයෝගීත්වයෙන් ඔබ සමග කතා නොකරන්නේ නම් එම ගැටළු කථන හා භාෂා චිකිත්සකවරයෙකු හරහා ඔබට නිරවුල් කරගත හැකිය.



සටහන
ලුතිනන් ඒ එම් මේනකා අධිකාරි
2 ශ්‍රීලයුහවෛසේබ
රණවිරු සෙවණ - රාගම



# සිතුවිලි සාගරය....

## ආදර අම්මා...

සීනි මුල තියෙද්දිත්
කහට බොන අම්මා...
රස්නෙ බත් උයද්දිත්
හීල් බත කන අම්මා...
හාල් අඩු දවසටම
බඩගිනි නොවන අම්මා...
දැල් ගවුමටම පෙම් බැන්ද
වැඩකාරි අම්මා...
හඳ පළුව නිදි කෙරුව
නැලවිල්ල අම්මා...
හිරු පළුව කුද්දපු
ගීතයයි අම්මා...
පඩි නැතුව වැඩ කරපු
කම්කරුව අම්මා...
රජ් ගෙදර මැටි ගෙදර
හදවතයි අම්මා...

සෙ/240640
බිහි 1 වයිඑම්ජීජීඑන් කුලසේකර බංඩා
මව්මෙ අම - යුහමු

## කළුවර නෙතක ඇවිලුනු මතක

වැලි කතරේ තල් අරණේ
ගන අඳුරේ රැය ගෙවුනේ
යුද ගිනිදැල් ගත දැවුනේ
ගත සිත නැත බිය දැනුනේ
මරු තුරුලේ යුද වැදුනේ
රැකගන්නයි නුඹ උතුරේ
නැත සැලුනේ නැත හැරුණේ
පසු බැස යන්නට සටනේ
යුද වැදුනේ ලේ හැලුනේ
රැක ගන්නයි නුඹෙ උරුමේ
වෙඩි හඬ යුද ගිනි නිවුනේ
යුද බිම සිත් තුළ නිවුනේ
නෙත කඳුලැල් නෙත හැඟුනේ
විඳිනට නිදහස් උරුමේ
යළි නැත නෙත් දෙක ඇරුනේ

නි/66794
කපිතාන් ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව් චන්ගසිංග
5 විපාරෙ

## අම්මා...

සතුට සයුර මත
කඳුලු කැට ඇත
ගැඹුර ජලය යට
දුක් සෝ සුසුම් ඇත
වසා හැකිලුණු සිනා ගඟුලැල්
මවයි සතුටු ලෝකයක
නිහඬව ගලායන
සතුටු සයුර ළඟ
හෙලපු දහඩිය ඇත
විඩාබර ඔබ...
සුසුමක් එගොඩ කරයි
ජීවන සිනා සිත්තම
සමග ඔබයි
ආදර මගේ අම්මා

සෙ/518775
කෝප්‍රල් සුසන්ත මිණිපුර ඒඑස්ජේ ආර්එස්පී
14 විපාරෙ

## නොමැකෙන මතක...

මේ පුංචි රටේ කොතැනක හෝ
අපි යළි හමුවේවි
එදාට හැම මතකයක්ම ඇවිස්සේවි
නුඹත් පසුතැවේවි
ඒත් අපිට ආයේ
අපේ වෙන්න බැරිවේවි

සෙ/484187
කෝප්‍රල් රත්නායක ආර්එම්ජීජීඑස්එම්
10 ගරෙ

## සැනසීම...

ජීවිතේ සැනසීම තියෙන්නෙ
අයිති කරගන්නා තැන නෙමෙයි
අතහරින තැනයි
ඒක දන්නෙ ජීවිතේ වටිනම දේවල්
අතහැරලත්
ජීවත්වෙන මිනිසුන් විතරයි

සෙ/321439
කෝප්‍රල් චන්ද්‍රරත්න එන්ඩීකේ
7 ශ්‍රීලපාහ

## ආදරේ නාමෙන්...

මගේ ළඟ නැති වුනාට
ඔයා මේ ලෝකෙ
කොහේ හෝ සතුටින්
ඉන්නවානම් මට ඒ ඇති....
මගේ ආදරේ නාමෙන්
ඔයා හැමදාමත්
සතුටින් ඉන්න ඕන....

සෙ/420441
සැරයන් එදිරිසිංහ ඊජීඑන්
12 ගැහේබ

## මගේ ලෝකේ...

හිතන්නවත් හිතකුත් නෑ
ලබන්න දේකුත් නෑ
මේ හැමදේම සුන්වී ගියේ
හඬන්නවත් කඳුලක් නෑ
පතන්නත් පැතුමක් නෑ
මුළු ලෝකෙම ඔබමයි උනේ
මට නොදැනිම ඔබ වෙන්වුනේ

සෙ/472498
කෝප්‍රල් ජයරත්න අයිආර්ආර්ජේ
6 ගරෙ



# සංචාරයක සටහන්...

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සිය තනතුරේ රාජකාරි භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ජනවාරි 25 සහ 27 යන දෙදින 52 වන පාබල සේනාංකයේ සහ 55 වන පාබල සේනාංකයේ සංචාරයක නිරත විය. එහිදී එම සේනාංකය යටතේ පාලනය වන බලසේනා සහ ඒකකයන්ට අයත් නිලධාරීන් සහ සෙසුනිලයින් ඇමතීමද සිදුකරන ලදී.





# නිරීක්ෂණ චාරිකාවක්...

වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී නව තනතුරේ වැඩ භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ජනවාරි 18 වන දින එම බලප්‍රදේශයේ ස්ථාපිත 54 වන පාබල සේනාංකයෙහි කඳවුරු සංචාරයක් සිදුකරන ලදී. අනතුරුව 542 වන බලසේනා මූලස්ථානය විසින් සංවිධානය කර තිබූ විල්පත්තුව ප්‍රදේශයේ පැළ 100ක් රෝපණය කිරීමේ වැඩසටහනක් සඳහාද සහභාගි වූ අතර, ඊට සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු සෙසුනිලයින් විශාල පිරිසක් එක්වූහ.












# නව ඇරඹුමක මතක සටහන්...



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) 2021 නව වසරේ වැඩකටයුතු ආරම්භ කිරීමේ සම්ප්‍රදායික උත්සවය එහි ආඥාපති මේජර් ජෙනරාල් ජේසී ගමගේ එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ජනවාරි 01 වන දින සිදුකෙරිණ. මෙහිදී ධජ එසවීම, රට වෙනුවෙන් දිවිපිදූ වීරෝධාර රණවිරුවන් සිහිපත් කිරීම සහ රාජ්‍ය ප්‍රතිඥාව ප්‍රකාශයට පත්කිරීම ඇතුළු කටයුතු සඳහා එම මූලස්ථානයේ රාජකාරියේ නියුතු සියලු හටපිරිස් එක්වූහ.





# දිරිය දරුවන්ට ඉගෙනුමට අත්වැලක්...





කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ එන්ඩීසී අයිජී ගේ මගපෙන්වීම යටතේ කිලිනොච්චි ප්‍රදේශයේ පාසල් සිසුන්ගේ අධ්‍යාපනය නගාසිටුවීමේ අරමුණින් අරිවුච්චෝලෙයි සහ මහාදේව සුවමිකල් ළමා නිවාස වෙත පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 03 වන දින සිදුකරන ලදී. එහිදී ඉගෙනුම ලබන දරු දැරියන් 300 දෙනෙකු සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීම සිදුවිය.



මේ සඳහා කොළඹ ප්‍රදේශයේ පදිංචි පවුලක් විසින් අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී. මෙම අවස්ථාව සඳහා කිලිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති, 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ෂමිනී ද සිල්වා මහත්මිය ඇතුළු පිරිසක් සහභාගී වූහ.



# නව වසරෙහි වැඩ අරඹමින්...



2021 නව වසර උදාව නිමිතිකොටගෙන මුලතිව් ආරක්ෂක සේනා මූලස්ථානයේද සැමරුම් උත්සවයක් සංවිධානය කොට තිබුණේ එහි ආඥාපති මේජර් ජෙනරාල් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙනි. මේ සඳහා එම මූලස්ථාන බ්‍රිගේඩියර් (පාලන/හකාස) බ්‍රිගේඩියර් ඒකේ රාජපක්ෂ ආර්එස්පී ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින් රැසක් සාමූහිකව එක්වූහ.









# නව වසර උදාව සනිටුහන් කරමින්...

බටහිර ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්ආර් ද ආබෲව් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ ප්‍රධානත්වයෙන් 2021 වර්ෂය උදාව සනිටුහන් කරමින් වැඩසටහන් මාලාවක් පැවැත්විණ.

ආඥාපති විසින් ජාතික ධජය එසවීමෙන් අනතුරුව සියළු නිලයින් ඇමතීමෙන් ලැබුවාවූ 2021 වර්ෂය වෙනුවෙන් සියලුදෙනා වෙත සිය සුභාශිංසන පළකරන ලදී. මෙම අවස්ථාව සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) බ්‍රිගේඩියර් (පාලන/භකාස) බ්‍රිගේඩියර් ටීඑම් අබේරත්න ආර්එස්පී ඇතුළු එම මූලස්ථාන රාජකාරියේ නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් සහභාගී වූහ.



# සංවර්ධනයට උරදෙමින්...



හෙවෙස්ස ප්‍රාථමික විද්‍යාල ක්‍රීඩා පිටිය, යටිපාන ප්‍රාථමික විද්‍යාල ක්‍රීඩා පිටිය සහ මතුගම ප්‍රදේශයේ පිහිටි මහජන ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ඉකුත් ජනවාරි 24 වන දින ඉංජිනේරු සේවා බලකායේ භටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් සහ 5 වන ක්ෂේත්‍ර ඉංජිනේරු රෙජිමේන්තුවේ තාක්‍ෂණික දැනුම උපයෝගී කරගනිමින් ආරම්භ කරන ලදී. "ගම සමග පිළිසඳරක්" කළුතර දිස්ත්‍රික් වැඩසටහනේදී එහි ප්‍රදේශවාසීන් අතිගරු ජනාධිපතිතුමාගෙන් කළ ඉල්ලීමකට අනුව එතුමන්ගේ නියමයෙන් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි මෙම කටයුත්ත සිදුකෙරිණ.







# ඒකක සංචාරයක්...

මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්පීඑන්කේ ජයපතිරණ ආර්එස්පී ඉකුත් ජනවාරි 13 වන දින 8 වන සන්නද්ධ බුද්ධි බලකායේ නිරීක්ෂණ චාරිකාවක නිරත වන ලදී. මෙම අවස්ථාවට 8 වන සන්නද්ධ බුද්ධි බලකායේ අණදෙන නිලධාරී මේජර් පීඑන්ඩී කපුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු ඒකකයේ නිලධාරීන් සෙබළුන් සාමූහිකව එක්වූහ.



# ජන දිවියට විරු සරණක්...

වන්නි ආරක්ෂක සේනා ආඥාපති ගේ සංකල්පයකට අනුව එම බලප්‍රදේශය තුළ ජීවත්වන බොහෝ දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් තෝරාගෙන ඔවුන් හට "හිසට වහලක්" තනාදීමේ නිවාස ව්‍යාපෘතියක් අරඹන ලදි. නමුත්, අදාළ ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමෙහිලා පැවති ප්‍රධාන අභියෝගය වූයේ ඒ සඳහා අවැසි මූල්‍ය ප්‍රතිපාදන සොයාගැනීමය. එහිදී 212 පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් පීඒඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ පුද්ගලික මැදිහත්වීම මත ඔහුගේ මිතුරන්ගේද සහයෙන් අදාළ නිවාස ව්‍යාපෘතිය සඳහා අවැසි වූ සම්පූර්ණ ප්‍රතිපාදන මුදල් සපයාදීමට කටයුතු කළේය.


ඒ අනුව රු : 800,000.00 ක් පමණ වටිනාකමින් යුත් අංග සම්පූර්ණ නිවාස 25 ක් ඉදිකොට තෝරාගත් දිළිඳු පවුල් 25 ක් අතර බෙදාදීමට කටයුතු කරන ලද්දේ එම නිවාසවලට අවශ්‍ය ගෘහ භාණ්ඩද සමග වීම විශේෂත්වයකි. සෙබළුන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ එම නිවාස ව්‍යාපෘතිය හරහා වන්නි බලප්‍රදේශයේ දිළිඳු පවුල් රැසක සිය මූලික අවශ්‍යතා ඉටුවූවා පමණක් නොව සිවිල් ජනයා හා යුද හමුදාව අතර විශ්වාසය හා අන්‍යෝන්‍ය බැඳීම වැඩිදියුණුවීමටද ඉවහල් වනු ඇත.











# අප රට තුළ "යුද සාහිත්‍යයක්" බිහිකළ යුත්තේ ඇයි?

> "පළමුවන දෙවන ලෝක යුද්ධවලින් පසුවද ලෝකයේ පැවැති වෙනත් ප්‍රධාන යුධ ගැටුම් අවසානයේද ඊට සම්බන්ධ වූ සෑම රටකම පාහේ යුද සාහිත්‍යයක් ලියවී ඇත. පසුකාලීනව එම යුද සාහිත්‍යය සිනමාව හරහාද මුළු ලොව පුරා ව්‍යාප්ත විය. ශ්‍රී ලංකාවේ 30 වසරක යුද්ධයක් අවසන්කොට ඇත. අප එම සටන නිමාකළේ ලොව දරුණුම ත්‍රස්තවාදය පරාජයකළ විශිෂ්ටතම හමුදාව ලෙස වූ අභිමානයද සමගිනි. නමුත් අවාසනාවකට අප රටෙහි එවන් යුද සාහිත්‍යයක් බිහිවී නොමැත"

ඇතැම් බලවත් රටවල් පවා තවමත් ත්‍රස්තවාදයෙන් බැටකමින් තිබේ. නමුත් අප එම යුගය පසුකර ඇත. සාමයේ අගය හා නිදහසේ වටිනාකම මේ යැයි පසක් කරමින් මෙරට තුළ දශක තුනක් ඇවිළුනු යුධ ගිනි නිවීමට අපි සමත් වූයෙමු. නමුත් එකී සාමය හා නිදහස වූ කලී බත්දේසියක තබා පුදනු ලැබූ හෝ නිරායාසයෙන් උරුම වූවක් නොවන්නකි. ඒ වෙනුවෙන් හෙලූ ලේ දහඩිය සේම කැපකළ ජීවිතවල වටිනාකම තක්සේරු කළ නොහැකිය. එබැවින් මතු පරපුරට එම යථාර්ථය අවබෝධ කරදීම සැමගේ වගකීමකි. එසේ නොමැති නම් අනාගතයේ කිසිවකුත් අප තිස්වසරක් පුරා යුද්ධයකට මැදිව ජීවිත පූජාවෙන් මේ මව්බිම නිදහස් කරගත් බව විශ්වාස නොකරනු ඇත.

පළමුවන දෙවන ලෝක යුද්ධවලින් පසුවද ලෝකයේ පැවැති වෙනත් ප්‍රධාන යුධ ගැටුම් අවසානයේද ඊට සම්බන්ධ වූ සෑම රටකම පාහේ යුද සාහිත්‍යයක් ලියවී ඇත. පසුකාලීනව එම යුද සාහිත්‍යය සිනමාව හරහාද මුළු ලොව පුරා ව්‍යාප්ත විය. ශ්‍රී ලංකාවේ 30 වසරක යුද්ධයක් අවසන්කොට ඇත. අප එම සටන නිමාකළේ ලොව දරුණුම ත්‍රස්තවාදය පරාජයකළ විශිෂ්ටතම හමුදාව ලෙස වූ අභිමානයද සමගිනි. නමුත් අවාසනාවකට අප රටෙහි එවන් යුද සාහිත්‍යයක් බිහිවී නොමැත. විටින් විට මේ පිළිබඳ සමාජයේ කතිකාවත් ගොඩනැගුනද, ඒ පිළිබඳ අතලොස්සක් පොත්පත් ලියවුනද යුද සාහිත්‍යයක් බිහිකිරීමට ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොමැත. මෙරට පැවති තිස්වසක යුද්ධය තුළ අප්‍රකට නොපල කතා බොහෝය. යුධ පුවත් පිළිබඳ දැනගන්නට කියවන්නට සමාජයේ කොතරම් ඉල්ලුමක් තිබුණද ඒ ගැන ලියන්නට ඉදිරිපත් වන්නන් හිඟය.

30 වසරක් පුරා අප රටෙහි පැවැති යුද්ධයට සක්‍රීයව දායකත්වය දක්වූ බොහෝ පිරිස් ගෙවීගිය කාලපරිච්ඡේදය තුළදී සේවයෙන් ඉවත්ව හෝ විශ්‍රාම ලැබ ඇත. ඉදිරියේදී ද තවදුරටත් එවැනි අය හමුදාවෙන් ඉවත්වනු ඇත. තවත් දශක දෙකක් පමණ ගිය තැන යුද හමුදාපතිගේ සිට අවසාන සෙබළා දක්වා කිසිදු යුද අත්දැකීමක් නොමැති පිරිසක් ශ්‍රී ලංකා යුද හමුදාව තුළ බිහිවනු ඇත. එය ඕනෑම රටක

**"යුද්ධයේ අත්දැකීම් සහිත සැමටම කියන්නට කතාවක් ඇත. තිස් වසක් තිස්සේ රණබිම තුළ ඔවුන් ඇසූ දුටු අත්දැකීම් එකී හදවත් තුළ තෙරපෙමින් කැකෑරෙමින් තිබේ. ඔවුන් විශ්‍රාම යාමට පෙර එකී කතා සමාජගත කිරීමේ වැදගත්කම මතුවන්නේ එබැවිනි. අපට යුද්ධයේ නටබුන් ඉතිරි කළ නොහැක. කළහැක්කේ එකී අත්දැකීම් මතු පරපුරට දැන කියාගන්නට ඉඩ හැරීමය. එය අද දිනයේ අප කවුරුන් හෝ කළ යුතුය. ඒ සඳහා අප රට තුළ යුධ සාහිත්‍යයක් බිහිකිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි"**

හමුදාවක ඇති විය හැකි සාමාන්‍ය තත්ත්වයක් බව සැබෑය. නමුත් යුද අත්දැකීම් යනු කෙනෙකු විශ්‍රාමය සමග රැගෙන යා යුතු දෙයක් නොවන්නේය. එය ඉදිරි රණවිරු පරපුර උදෙසා බෙදාදිය යුතු දෙයකි. අනාගත හමුදාවක අභිමානය රඳා පවතිනුයේ එකී අත්දැකීම් මතින් ලබන පන්නරය තුළිනි.

සටන්බිම තුළ මියගිය සෑම විරුවෙකුම අවසන් හුස්ම පොද හෙළනු ලැබුයේ පියවි සිහියෙනි. එකී අවසන් මොහොතේ ඔවුන් බැලුවේ තම ආසන්නතම සගයා දෙසය. නොඑසේනම් උපන් මහපොළව දෙසය. මියෙන්නට පෙර ඔවුන්ගේ හදවත් තුළ කියන්නට කතාවක් ඉතිරිව තිබිණ. ඒ බව අවසන් බැල්ම රැඳි ඔවුන්ගේ ඇස්වල සටහන්ව තිබුණේය. සිරුර විනිවිද වෙඩිඋණ්ඩ ඇදියද්දීත්, තම ශරීර අවයව සිඳිබිඳී යද්දීත්, අවසන් මොහොත තෙක් "උපන්බිම සුරකිමි" යි යන උතුම් අරමුණින් බැහැර නොවී මරණය හමුවේද සිනාසුණු විරුවන් සිටියහ. පුද්ගලයකුට ජීවිතය හමුවේ කළ හැකි කැපකිරීම්වල සීමාව කොතෙක්ද? ඒ අසීමාන්තික කැපකිරීම රණවිරුවකුට හැර අන් කිසිවකුට කළ හැකිද? මියෙන බව දැන දැනත් අන් අය වෙනුවෙන් තම ජීවිතය කැපකරන්නට කිසිවකුත් පෙළඹෙන්නේ නම් ඒ රණවිරුවන් මිස අන් කවුරුන්ද?


රණබිම තුළ සතුරන් අභිමුව පෙරමුණේ සටන් වැදීම අතිශය බිහිසුණු අවදානම් සහගත කාර්යයකි. එබැවින් ඊට මුහුණදෙන ඕනෑම අයෙකුගේ වීරත්වය හා එඩිතර බව පිළිබඳ විවාදයක් නොමැත. එසේම සංග්‍රාමයේ අසීරු අවස්ථාවලදී ගැලවී ඒමට හැකියාව තිබියදීත් තම සගයන් දමා යා නොහැකිව මියෙන තුරුම සටන්වැදී විරුවන්ද, දහස් ගණන් සතුරු සමූහය මැද සියලු කාරණා සතුරන්ගේම වාසියට හැරවී ඇති පසුබිමක ඔවුන්ගේ උකුසු ඇස් මඟහැර කිසිවෙකු ජීවිතය බේරා ගැනීමට සමත් වන්නේ නම් එය ද ආශ්චර්යයක්ම වන්නේය. එය වූ කලී දරාගැනීම, ඉවසීම හා අසීමිත කැපකිරීම හමුවේම පමණක් සිදුවන්නක් වන අතර යුධ සෙබළෙකුට හැර අන් කිසිවෙකුට එය කළ හැකිද නොවේ. එබැවින් ඔවුන්ගේ එකී මෙහෙවරද ඓතිහාසිකව ඇගයීමට බඳුන්විය යුතුය.

ගෙවීගිය තිස්වසක් තිස්සේ ත්‍රස්තවාදීන්ට එරෙහිව පැවති යුද්ධයේදී 27,000 කට ආසන්න රණවිරු පිරිසක් තම ජීවිත රට වෙනුවෙන් කැපකොට ඇති අතර ඒ සෑම රණවිරුවකු වෙනුවෙන්ම සේවයේ උසස්වීම්, සම්මාන, පදක්කම්, වන්දි හෝ වෙනත් වරප්‍රසාද ඕනෑ තරම් හිමිවිය. නමුත් එවැනි භෞතික කිසිවකගෙන් පමණක් ඔවුන්ගේ උත්තම මෙහෙවර තක්සේරු කළ නොහැකිය. ඒ සෑම මියයාමක් වෙනුවෙන්ම ඓතිහාසික වටිනාකමක් ලබාදිය යුතුය. එය කළ හැක්කේ ඔවුන් පිළිබඳ මතක වත්මන් හා මතු පරපුරේ හදවත් තුළට කා වැද්දීමෙන් පමණමය. මේ පොළව මත ඔවුන් යළි නොඉපදෙන බව සැබෑමුත්, අප ඔවුන් මතු පරපුරේ හදවත් තුළ ජීවමාන කළ යුතුය.

යුද්ධය තුළ ඇත්තේ කුරිරු බව හා මිලේච්ඡත්වයයි. ඉන් විනාශයක් මිස අන් දෙයක් සිදු නොවේ. එබැවින් යුද්ධය පිළිබඳ නව නවත් වරනැගීම, හාරා ඇවිස්සීම නොකළ යුතු බව ඇතැමුන්ගේ මතයයි. නමුත් යුද්ධය කොතරම් අමිහිරි වුවද අප්‍රසන්න වුවද එය මෑත ඉතිහාසය තුළ මේ ලක්දෙරණේ යථාර්ථයක්ව පැවති බව අප අමතක නොකළ යුතුය. එසේම කිසියම් යුද්ධයක හොඳ නරක හෝ වටිනාකම තීරණය කළ හැක්කේ යුධ වැදීමේ අරමුණට සාපේක්ෂවය. රණවිරුවන් කිසිවිටෙකත් යුද්ධය හඹා ගියේ නැත. බලෙන් ගෙන්වා ගත්තේද නැත. සියලු සාමකාමී උත්සාහයන්වල අවසන් තෝරාගැනීම එය වූ නිසාම ඒ සඳහා අවතීර්ණ වූවා පමණි. එය ඓතිහාසිකව ඔවුන් වෙත පැවරුණු අනුලංඝනීය වගකීමක්ද ඉෂ්ට කිරීමකි.

ගෙවීගිය තිස්වසක් තිස්සේ ත්‍රස්තවාදීන්ට එරෙහිව පැවති යුද්ධයේදී තම ජීවිත රට වෙනුවෙන් කැපකොට ඇති සෑම රණවිරුවකු වෙනුවෙන්ම ඓතිහාසික වටිනාකමක් ලබාදිය යුතුය. මේ පොළව මත ඔවුන් යළි නොඉපදෙන බව සැබෑමුත්, අප ඔවුන් මතු පරපුරේ හදවත් තුළ ජීවමාන කළ යුතුය. එය කළ හැක්කේ ඔවුන් පිළිබඳ මතක වත්මන් හා මතු පරපුරේ හදවත් තුළට කාවැද්දීමෙන් පමණමය. යුද්ධයේ අත්දැකීම් සහිත සැමටම කියන්නට කතාවක් ඇත. තිස් වසක් තිස්සේ රණබිම තුළ ඔවුන් ඇසූ දුටු අත්දැකීම් එකී හදවත් තුළ තෙරපෙමින් කැකෑරෙමින් තිබේ. ඔවුන් විශ්‍රාම යාමට පෙර එකී කතා සමාජගත කිරීමේ වැදගත්කම මතුවන්නේ එබැවිනි. අපට යුද්ධයේ නටබුන් ඉතිරි කළ නොහැක. කළහැක්කේ එකී අත්දැකීම් මතු පරපුරට දැන කියාගන්නට ඉඩ හැරීමය. එය අද දිනයේ අප කවුරුන් හෝ කළ යුතුය. ඒ සඳහා අප රට තුළ යුධ සාහිත්‍යයක් බිහිකිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි.

සටහන -
මේජර් ජුවින් චමින්ද විජේසිංහ







# කඳවුරු සංචාරයක්...

12 වන සේනාංකයේ සේනාංකාධිපති මෙන්ම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීඑම්එච්ඩී බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඉකුත් ජනවාරි 07 වන දින 16 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කඳවුරු සංචාරයක නිරත විය. එහිදී සේනාංකාධිපති විසින් සියලු භටපිරිස් ඇමතීමටද කටයුතු කළේය. එම අවස්ථාව සඳහා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ඩීඑම්පීඩී දිසානායක ආර්ඩබ්ලිව්පී ඇතුළු නිලධාරීන්, සෙබළුන් රැසක් සහභාගී වූහ.



# පළතුරු පැළ සිටුවීමේ වැඩසටහනක්...

යුද්ධ හමුදාධිපතිතුමාගේ "තුරු මිතුරු නව රටක්" සංකල්පයට සමගාමීව නව වසර උදාවත් සමග රාජකාරි ආරම්භ කරමින් පානළුව ගොවිපලෙහි නිලධාරී අණදෙන මේජර් කේඑම්ආර් රණසිංහ විසින් පළතුරු පැළ සිටුවීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. ඒ සඳහා 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් සීඑස් දේමුණි ඇතුළු නිලධාරීන්, සෙබළුන් රැසක් සහභාගී වූහ.

# විදුබිම නැගුමට විරු සහාය...






ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ඉංජිනේරු භටපිරිස් විසින් හිඟුරක්ගොඩ රජරට විද්‍යාලයේ නව පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ එහි ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදුකරන ලදී. අතිගරු ජනාධිපතිතුමා 2020 දෙසැම්බර් මස 16 දින මැදිරිගිරියේ පැවති "ගම සමග පිළිසඳරක්" වැඩසටහනේදී සිසුන්, දෙමාපියන් සහ ගුරුවරුන් විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර ලෙස ජනාධිපතිතුමන්ගේ නියමයෙන් යුද්ධ හමුදාව මෙම කටයුත්තට දායක විය.

ඒ අනුව, යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු සහ ඉංජිනේරු බලකායේ බලසේනාධිපති ගේ අධීක්ෂණයෙන් සිදුකළ එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 7 වන ක්ෂේත්‍ර ඉංජිනේරු රෙජිමේන්තුවේ යන්ත්‍රෝපකරණ හා තාක්ෂණික දැනුම උපයෝගී කරගන්නා ලදී.

# බලඇණි පුහුණුව අවසන් කරමින්...





572 වන පාබල බලසේනා මූලස්ථානය යටතේ රාජකාරී කරනු ලබන 6 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ බලඇණි පුහුණු පාඨමාලාව 2020 නොවැම්බර් 09 වන දින සිට දෙසැම්බර් 16 වන දින දක්වා බලඇණි පුහුණු පාසල අම්පකාමම් හිදී පැවැත්විණ. එම පුහුණුව සඳහා අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් 05 ක් සහ සෙසුනිලයින් 160 දෙනෙකු සහභාගි වූහ.



# ප්‍රීතිමත් බව ප්‍රගුණ කළ යුත්තක්.....

"අද දවස තමයි මගේ ජීවිතේ ප්‍රීතිමත්ම දවස" යි, මගේ සය හැවිරිදි පුතා පැවසුවේ මා ඔහුට තිළිණ කළ වීඩියෝ සෙල්ලම් කට්ටලය විවෘත කරමිනි. ගිය සතියේ දිනකදී වෙනත් හේතුවක් උදෙසා ඔහු එයම පැවසීය.

මම ඔහුගේ මේ හැසිරීම ගැන වඩාත් ගැඹුරට සිතා බැලුවෙමි. අද ප්‍රීතිමත්ම දවස ලෙස පැවසුවද පසුගිය පැය ගණනාවම ඔහු ගත කළේ මුහුණ එල්ලාගෙනය. දවල් කෑමට පෙර අතිරේක කෑම ගැනීමට ඔහුට ඉඩ නොදීම සහ සෙල්ලම් කිරීමට යෑමට පෙර ඔහුගේ කාමරය පිරිසිදු කිරීමට මා නියෝග කිරීම ඊට හේතු විය.

ප්‍රීතිමත් බව යනු එක්තරා මානසික තත්ත්වයක් නොව විශේෂ හැඟීමක්ද බව මනෝවිද්‍යාඥ "එඩ්වඩ් ඩයිනර්" පවසයි. ප්‍රීතිමත් භාවයේ මානසික තත්ත්වය එනා ඇතිවී නැතිවී යන සුළු එකකි. මුහුණ විකෘති කළ පමණින් මගේ දෙහැවිරිදි දියණිය මේ තත්ත්වයට පත් කිරීමට මට හැකිය.

එහෙත් ප්‍රීතිමත් භාවයේ විශේෂ හැඟීම මීට වඩා ස්ථාවරත්වයකින් යුක්තය. "ඩයිනර්" මෙය විස්තර කරන්නේ යහපත් හැඟීම් පිළිබඳ පෙරහුරුවක් වශයෙනි. මගේ දියණිය මදහසකින් යුතුව නිදි ඇඳෙන් පිබිදෙන විට මම එය ඇය තුළින්ම දකිමි. ජීවිතය කම්කටොලුවලින් පිරී තිබෙන කල්හි පවා ඇයට සුබවාදී ආකල්පයකින් යුතුව හිනැහීමට හැකියාව ඇත.

ළමාවියේදී ඇතිවන කුඩා ප්‍රශ්නවලට මුහුණදීමට පුරුදු පුහුණු වීමෙන් මෙම හැකියාව ප්‍රගුණ කරගත හැකිය. ඔබට ඉතාමත්ම ප්‍රීතිමත් ළමාවියක් තිබුණේ නම් ඔබේ වැඩිහිටි විය අසතුටුදායක එකක් විය නොහැකිය "ඩෙනිස් ප්‍රැගර්" පවසයි. "ප්‍රීතිමත් භාවය බරපතල ප්‍රශ්නයක්" නම් පොතේ කර්තෘවරයා ඔහුය. "සත්තකින්ම ළමාවියේදී වේදනා හෝ බලාපොරොත්තු කඩවීමක් ඇති නොවුනේ නම් ඒක වැඩිහිටි විය අසතුටුදායක වන බවට සාක්ෂියක්" ඔහු තවදුරටත් පවසයි.

ප්‍රීතියෙන් ජීවත්වීම යනු මෙවැනි දෙයක්යයි කිසිවෙකුට ඇඟිල්ල දිගු කොට පෙන්වීමට හැකියාවක් නැත. එහෙත් පර්යේෂකයින් විසින් පෙන්වා දී ඇති පරිදි ප්‍රීතියෙන් ජීවත්වීම සඳහා කුඩා කල සිටම නම් දරුවන් හුරු පුරුදු කරවීම දෙමාපියන් සතු වගකීමකි. පහත සඳහන් ක්‍රම අනුගමනය කිරීමෙන් ඔබටත් මෙය කළ හැකිය.

> "ඔබේ දරුවන් ප්‍රීතිමත් සම්පූර්ණ අය බවට පත්කිරීමට නම් කළයුතු හොඳම දෙය මව්පියන් වූ ඔබ සතුටින් සිටීමයි." සතුටින් ජීවත්වන පවුලකින් පැවත එන දරුවා අනෙක් අයට වඩා විසි ගුණයකින් ප්‍රීතිමත් පුද්ගලයෙක්."

**ඔබේ දරුවාට තෝරාගැනීම්වලට ඉඩ දෙන්න.**

පර්යේෂකයින් විසින් සොයාගෙන ඇති පරිදි ලොතරැයියකින් දිනුමක් ඇදුණු අය වඩා සතුටකින් සිටින්නේ නැත. "ඒ දිනුම ඇත්තටම තමන් තුළින් ලබාගත්ත දිනුමක් නොමෙයි" මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය "ජෝන් රීව්" පවසයි. එසේ කෙනෙකුගේ ජීවිතය තුළින්ම නැගී එන ජීවිතය සමඟම අත්වැල් බැඳගත්

දෙයකි.

ජීවිතයේ ප්‍රීතිමත් සමය ළමාවිය යන්න මිත්‍යාවක් බව මෙයින් පැහැදිළි වෙයි. ළමාවියේදී ඔවුන් වෙනුවෙන් බොහෝ තීරණ ගන්නේ දෙමාපියන්ය. ළමයින්ගේ අදහස් බොහෝවිට ප්‍රතික්ෂේප වෙයි. මෙහි ප්‍රතිඵලයක් වන්නේ වැඩිහිටියන් සිතනවාට වඩා ළමාවිය අසුන්දර වීමයි.

ඇත්තෙන්ම තීරණ ගන්නන් වශයෙන් දෙමාපියන් රඟපාන චරිත අතහැරීමට ඔවුනට හැකියාවක් නැත. එහෙත් ළමුන් ඒවාට සහභාගී කරවා ගැනීමට ඇති ඉඩකඩ ගැන මව්පියන් සොයා බැලිය යුතුය. වයසින් කොතරම් ලාබාල වුවද තමන්ගේ ප්‍රීතියට බාධාවක් නොවන පරිදි තීරණ ගැනීමට ළමෝ දක්ෂ වෙති.

එහෙත් ළමයින්ගේ තෝරාගැනීම් වලට ඉඩදීම ප්‍රීතිමත් භාවයට සහතිකයක් නොවන බව මව්පියන් දැන සිටීම වැදගත්ය. ඇතැම් අවස්ථාවල දරුවන් ප්‍රීතියෙන් සිටිනු දක්නට ලැබේ. ඇතැම් විට විනෝද ගමනක් යද්දී පවා ඉතා සුළු හේතුවකට මුහුණ එල්ලා ගැනීම ළමයින්ගේ සිරිත බව ඔබ අත්දැක ඇතුවා නිසැකය.

"ප්‍රීතිමත් බව කියන්නේත් එක්තරා අයිතිවාසිකමක්. ඒ නිසා අසතුටින් සිටින්නටත් හැමදෙනාටම අයිතියක් තියෙනවා. ඒත් මේ හේතුවලට අනුව අපේ ප්‍රතිචාර හැඩගස්වා ගැනීමට අපිට හැකියාව තියෙනවා" ප්‍රේගර් පවසයි.

**ළමයින් සමඟ සමීප සම්බන්ධතාවයන් පවත්වා ගන්න.**

සමීප සම්බන්ධතාවයන් පවත්වා ගැනීම ප්‍රීතිමත් භාවයට හොඳ රුකුලකි. ළමයින්ගේ සමාජ ජීවිතය පාලනය කිරීමට දෙමාපියන්ට හැකියාවක් නැති වුවද ඔවුන් සමඟ උණුසුම් සතුටුදායක සම්බන්ධතාවයන් පවත්වා ගැනීමෙන් ළමයින්ගේ හැඟීම් පෝෂණය කිරීමට හැකියාව ඇත.

"ළමයින් අනිත් මිනිසුන් සමඟ සමීප වෙන්නේ මව්පියන් හොඳින් ළමයින්ට සමීප වෙලා හිටියොත් විතරයි" මනෝවිද්‍යාඥ කැරොල් රීෆ් පවසයි. අනෙක් ළමයින් සමඟ ක්‍රීඩා කිරීමට හෝ කාණ්ඩ වශයෙන් කෙරෙන වෙනත් ක්‍රියාකාරකම්වලටද දරුවන් පෙළඹවීමද මව්පියන් විසින් කළයුතු දේවල්ය. මිතුරු මිතුරියන් නිවසේදී උණුසුම්ව පිළිගැනීමටද දරුවා හුරු පුරුදු කළ යුතුය.

නිවසේදී එකිනෙකාගේ අත්දැකීම් හුවමාරු කර ගැනීමටද දෙමව්පියන් හා දරුවන් හුරු පුරුදු විය යුතුය. ඔවුනට විවෘත අදහස් පල කිරීමට ඉඩදීම ප්‍රීතිමත් බව ඇති කිරීමට හේතුවකි.

**භාණ්ඩ හිතකාර ක්‍රියාවන්ට එරෙහිවන්න.**

ප්‍රමාණවත් ආර්ථික තත්වයක් ඇති අය එවැන්නක් නැති අයට වඩා ප්‍රීතිමත් බව සියළු දෙනාම දන්නා සත්‍යයකි. පර්යේෂණවලින්ද ඒ බව ඔප්පුවී තිබේ. මූලික අවශ්‍යතා පිරිමසාලීමට තරම් ආර්ථික තත්වයක් තිබිය යුතු අතරම ලද දෙයින් සතුටුවීමටද හැකියාව තිබිය යුතුය.

"ළමයින්ට ඕනෑවට වඩා දේවල් ලබාදීම නිසා ඔවුන් සතුටින් සිටිනවා යැයි සිතීම මායාවක් විතරයි" පවුල් මනෝවිද්‍යා ජෝන් රිස්මන්ඩ් පවසයි. සිය දරුවන්ගේ ක්‍රීඩා භාණ්ඩ ප්‍රමාණය අඩුකළ විට ඔවුන් වඩාත් සතුටින් සහ උපාය දක්ෂ බවින් යුක්ත වූ බව රිස්මන්ඩ් සොයා ගත්තේය. ඔවුන් වඩාත් නිර්මාණශීලී වන්නේද එවිටය.

මෙයින් අදහස් වන්නේ ළමයින්ට තෑගි නොදිය යුතු බව නොවේ. එහෙත් ඔවුන්ගේ ප්‍රීතිය රඳා පවතින්නේ සෙල්ලම් බඩු වැනි ද්‍රව්‍යමය දේවල් මත නොවන බව ඔවුනට වැටහෙන්නට ඉඩ හැරිය යුතුය.

**විවිධ දේවලින් සතුටු වෙන්නට දරුවා උනන්දු කරවන්න.**

ප්‍රීතිමත් පුද්ගලයන් සමතුලිත ලෙස ජීවත් වෙනවා යැයි "මයිකල් පෝර්ඩයිස්" පවසයි. ප්‍රීතිමත් භාවය මනෝවිද්‍යාව පොතෙහි කතෘවරයා ඔහුය. එම නිසා ඔවුනට සතුටින් ජීවත්වීමට හුගක් හේතු තියෙනවා. එකම දෙයකින් සතුටු වෙන අය පමණක් සතුටු වෙන අය හරියට සෙලවෙන පොළවක හිටගෙන ඉන්න අය වගෙයි.

උදාහරණයක් වශයෙන් සවසට ඇති රූපවාහිණී දර්ශනයකින් සතුටට පත්වන ළමයෙකු ගත හැකිය. තම වැඩසටහන නොතිබූ විට ඔහුගේ මුළු සවස් කාලයම අපතේ යයි. එහෙත් විවිධ දේවලින් එනම් පොත් කියවීමෙන් හෝ ක්‍රීඩාවක යෙදීමෙන් සතුටුවීමට හැකි ළමයින්ගේ කාලය එසේ අපතේ යන්නේ නැත.

ළමයින්ගේ අවධානය වඩාත් යොමු වන්නේ කුමන දේවල් කෙරෙහිදැයි දෙමාපියන්ට හරියටම දැන ගැනීමට හැකියාවක් නැත. එහෙත් විවිධ දේවල්වලට ළමයාගේ සිත යොමු කිරීම සුදුසුය. බොහෝ විට ළමයින් එකම දෙයක් කෙරෙහි විශේෂ දක්ෂතාවයක් දක්වති. මෙවැනි ළමයි සිය දක්ෂතාවය පිළිබඳ වඩාත් අවධානයකින් කටයුතු කරති. එය හඳුනාගෙන ඒ පිළිබඳව ළමයා උනන්දු කරවීම දෙමාපියන්ගේ වගකීමකි.

**ප්‍රශ්නවලින් නොසැලී සිටින්නට දරුවා හුරු කරවන්න.**

"මොන තරම් ප්‍රීතියෙන් සිටින අය වුනත් කරදර කම්කටොළු වලට මුහුණ දෙන්නට සිදුවෙනවා" පෝර්ඩයිස් පවසයි. ඒත් ඔවුන් ඉක්මනින් ප්‍රකෘති තත්වයකට පත්වෙනවා. හැම අඳුරු වලාකුලකම රිදී රේඛාවක් ඇති බව දෙමව්පියන් විසින් ළමුන්ට පහදා දිය යුතුය. වෙනස් කළ නොහැකිම අන්දමේ ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදුවූ විට සැනසීමට හේතු සොයාගැනීමට ළමයින්ට ආධාර කළ යුතුය. හැම දෙනාටම හොඳ අවස්ථාවලට පමණක් නොව නරක අවස්ථාවලටද මුහුණ දෙන්නට සිදුවෙයි. මේවාට එකිනෙකා මුහුණ දෙන්නේ විවිධාකාර අන්දමටය. ප්‍රශ්නවලින් සිත හෙම්බත් කර නොගෙන පොතක් කියවීම, සංගීතයට සවන්දීම, බයිසිකලයක් පැදීම හෝ මිතුරෙකු සමඟ ප්‍රශ්නය ගැන කථාකර සිත සැහැල්ලු කර ගැනීමට ළමයාට උදව්දීම දෙමව්පියන් විසින් කළ යුතුම දේවල්ය.

**ඔබේ නිවස ප්‍රීතිමත් තැනක් බවට පත්කර ගන්න.**

"ඔබේ දරුවන් ප්‍රීතිමත් සම්පූර්ණ අය බවට පත්කිරීමට නම් කළයුතු හොඳම දෙය මව්පියන් වූ ඔබ සතුටින් සිටීමයි" පෝර්ඩයිස් පවසයි. සතුටින් ජීවත්වන පවුලකින් පැවත එන දරුවා අනෙක් අයට වඩා විසි ගුණයකින් ප්‍රීතිමත් පුද්ගලයෙක්.

මේ සම්බන්ධය ඇතැම් විට ප්‍රවේණිගත සම්බන්ධයක් වන්නට ද ඉඩ ඇත. නමුත් ප්‍රීතිමත්භාවය ඇතිවීමට මව්පියන් විසින් නිර්මාණය කරනු ලබන ප්‍රීතිමත් පරිසරයද බලපායි. ළමයින් හැඟීම් ඉගෙනගන්නේ ජීවිතයේ පළමු වසර කිහිපයේදීයි. කථාකරන්නට, ඉගෙනගන්නට පෙර ඔවුන් පරිසරයෙන් හැඟීම් උකහා ගන්නවා. "ලෝකය තරහින් හා සැකයෙන් පිරුණු එකක්ද, ප්‍රීතිමත් තැනක්ද, යන්න ඔවුන් තීරණය කරන්නේ ඒ අනුවයි" පෝර්ඩයිස් පවසයි. පරිසරයෙන් ලැබෙන සතුට පමණක් නොව, සිය ජීවිතය තුළ ඇති සතුටද හැඳිනගත හැකි ළමයාට මුළු ජීවිත කාලයම සතුටින් ගතකරන්නට හැකියාව ලැබෙනු ඇත.

*කැරොලයින් ජැකිස්*
*(1991 දෙසැම්බර් මිහිර)*



# ඉගෙනුමට අත්වැලක්...

අති දුෂ්කර ප්‍රදේශයක් වන පලුගස්වැව ග්‍රාමයේ පිහිටි අ/පුස්දිවුල් වැව විද්‍යාලයේ 1 වසරේ සිට 5 වසර දක්වා සිසු දරුවන් වෙත පාසල් උපකරණ කට්ටල බෙදාදීමේ වැඩසටහනක් එම විද්‍යාලයේ විදුහල්පති, ගුරු භවතුන් හා දෙමාපියන්ගේ සහභාගීත්වයෙන් ඉකුත් ජනවාරි 24 වන දින සිදුකරන ලදී. 53 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ඉල්ලීම පරිදි පරිත්‍යාගශීලීන් කිහිපදෙනෙකුගේ දායකත්වයෙන් මෙම මාහැඟි කටයුත්ත සිදුවිය.



# සංචාරයක සොඳුරු මතක...



111 වන පාබල බලසේනා මූලස්ථානයේ 10 වන සංවත්සරය ඉකුත් ජනවාරි 30 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් බලසේනාධිපති කර්නල් ටීඑම්ආර්බී රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් සංවත්සර වැඩසටහන් මාලාවක් අභිමානවත් අයුරින් පවත්වන ලදී.

එහිදී ඉකුත් ජනවාරි 28 සහ 29 යන දෙදින තුළ රට ජාතිය වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහිකරමින් සහ කොරෝනා වසංගත තත්වයෙන් මිදීමේ අදිටනින් පුණ්‍යානුමෝදනා සිදුකිරීම සඳහා කඳවුරු පරිශ්‍රය තුළ පිහිටි විහාරස්ථානයෙහි, මහනුවර ශ්‍රී දළදා මාලිගාවෙහි සහ සතර මහා දේවාලයෙහි ආශිර්වාද පූජාවන් පවත්වන ලදී. තවද බලසේනාධිපති වෙත සම්මාන මුරයක් පිරිනැමීම, හවපිරිස් ඇමතීම, සියළු නිල තේපැන් සංග්‍රහයක් පැවැත්වීම සංවත්සර දින වැඩසටහන් අතර කැපී පෙනුනි.







# මාහැඟි පරිත්‍යාගයක්...

7 වන බලඇණිය ගජබා රෙජිමේන්තුවේ 30 වන සංවත්සර දිනය නිමිත්තෙන් අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව්එස්ඇයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ගේ මඟපෙන්වීම මත කොඩිකාමම් ප්‍රදේශයේ ගැබිණි මව්වරුන් 30 දෙනෙකු වෙත අත්‍යාවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කරන ලදී. මෙම සත්කාරක වැඩසටහන ඉකුත් ජනවාරි මස 01 වන දින කෙත්පේලි පවුල් සෞඛ්‍ය සේවා කාර්යාලයේදී සංවිධානය කර තිබූ අතර, එය 52 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. එහිදී සියලු ගැබිණි මව්වරුන්ට හා පැමිණ සිටි සිවිල් වැසියන් හට අඹ, පේර හා දෙහි පැළ ලබාදීමද සිදුකරන ලදී.





# අවැසි මොහොතක සරණක් වෙමින්...

62 වන පාබල සේනාංකයේ රාජකාරි කරනු ලබන භෝජනාගාර සේවකයෙකු වන එච්එම්එම් සිරිවර්ධන යන අයගේ ඉල්ලීමක් සපුරාලමින් ඉකුත් ජනවාරි මස 02 වන දින ඔහුගේ නිවසට සියලු පහසුකම් සහිතව නාන කාමරයක් ඉදිකරදෙන ලදී. එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මූල්‍ය දායකත්වයෙන් සිදුකළ මෙම ඉදිකිරීම සඳහා ලා/කෝ ෂෙල්ටන් ඩී (7 ශ්‍රීලසසබ) යන සෙබලා විසින් දින 4 ක් තුළදී පෙදරේරු කටයුතු සිදුකිරීම විශේෂත්වයකි.





# ඒකක සංචාරයක්...

3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ නවතමයෙන් ඉදිකරන ලද "තුරු අරණ" සෙසුනිල නිවාඩු නිකේතනය හා රෙජිමේන්තු සැරයන් මේජර් නේවාසිකාගාරය ඉකුත් ජනවාරි මස 09 වන දින ඉදිරි තඩත්තු පෙදෙස (උතුරු මැද) ආඥාපති මේජර් ජෙනරාල් එල්පීආර් ප්‍රේමලාල් යූඑස්පී ගේ සුරතින් විවෘත කරන ලදී. එහිදී සියලු නිලයින් ඇමතීමටද කටයුතු කළ බලකාධිපති විසින් පොලිස් හේවා බලකා ක්ෂේත්‍ර රාජකාරී ඉටුකිරීම, විමර්ශන සිදුකිරීම, විනය උසස් මට්ටමකින් පවත්වා ගැනීම හා පාලන රාජකාරී සබැඳිව දැනුවත් කරන ලදී.





# සංවත්සර දින සමරා...

4(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ 14 වන සංවත්සරය ඉකුත් ජනවාරි මස 09 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩබ්ලිව්එම්එස්එම්බී වන්සේකර ඒඩ්ටීම් ගේ ප්‍රධානත්වයෙන් ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් වැඩසටහන් මාලාවක් ක්‍රියාවට නැංවුණි. එහිදී නවතමයෙන් ඉදිකළ රෙජිමේන්තු පොලිස් අංශය සහ සිවිල් සේවක නිවස්නය අණදෙන නිලධාරී විසින් විවෘත කරන ලද අතර, එදින ඒකක සියලු නිල දිවා භෝජන සංග්‍රහයක්, ඒකකයේ රාජකාරී කරනු ලබන සෙනින්ගේ 2020 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් වූ දරුවන් හට පොත් බෙදාදීමක්, නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයෙහි බෝධිපූජා පිංකමක්ද පවත්වන ලදී.






# සංවත්සර දිනයේ මතක සටහන්...

55 වන පාබල සේනාංකය ස්ථාපිත කර ඉකුත් දෙසැම්බර් මස 23 වන දිනට වසර 24 ක් සපිරිණ. ඒ නිමිත්තෙන් එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්පීකේජී පිලපිටිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් සංවත්සර වැඩසටහනක් පවත්වන ලදී. එහිදී සේනාංකාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් පිළිගැන්වීමද, සියලු නිල භෝජන සංග්‍රහයක් පැවැත්වීමද, අභිනවයෙන් ඉදිකළ සෙසුනිල මුළුතැන්ගෙය විවෘත කිරීමද සිදුකෙරුණු අතර එහිදී සේනාංකාධිපති විසින් භට පිරිස් අමතන්නටද කටයුතු කළේය. මෙම අවස්ථාවට බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීවරු ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.





# පාසල් උපකරණ පරිත්‍යාගයක්...

මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටි ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ පාසල් සිසු සිසුවියන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් දෙසැම්බර් 31 වන දින 64 වන සේනාංක මූලස්ථානයේදී සිදුකරන ලදී. කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය මිතුරු කැල සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථි මිතුරු කැල ගේ මූල්‍ය දායකත්වයෙන් රු 4000.00 ක් වටිනා පොත් කට්පල් 50 ක් පරිත්‍යාග කිරීම මෙහිදී සිදුවිය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් 64 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒපී පල්ලාවෙල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගි විය.






# සංචාරයක සටහන්...

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා සංඥා බලකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීඒපීඑන් දෙමටන්පිටිය එන්ඩියූ පීඑස්සී ඉකුත් ජනවාරි 10 වන දින පලාලි හි පිහිටි 3 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සංචාරයක නිරත විය. එහිදී හෙතෙම යුද්ධයේදී මියගිය සංඥා බලකායට අයත් සියලුම නිලධාරී සහ සෙසුනිලයින් සිහිපත් කොට එහි ස්මාරකය අභියස මල් කළඹක්ද තැන්පත් කරන ලද අතර, අනතුරුව එහි භට පිරිස් ඇමතීමටද අමතක නොකළේය.





# සංචාරයක මතක...

ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් ඩබ්ලිව්පීඒකේ තිලකරත්න පීඑස්සී විසින් ඉකුත් ජනවාරි 22 වන දින 7 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සංචාරයක නිරත විය. එහිදී ඔහු වෙත කඳවුරු සම්මාන මුරයක් පිළිගැන්වුණු අතර අනතුරුව හෙතෙම රුක්රෝපණ වැඩසටහනකටද එක්විය.

## ආධුනික සෙබළා...

ආසාවට
බැඳුනෙ යුද්ධ හමුදාවට
රට දැය පෙරට
ගන්න වෙහෙසෙන එදින සිට
යුද්ධය ඇති විටෙක
ආරක්‍ෂාව හැම තැනම
දැනුණේ සිතට හැඟුමන් එවිට
කරන වැඩ ටිකට
වදන් අපමණ විඳිමි ගත සිතට
නොදන්නා තැනක
දැනගන්න වෙර දරන
හුරුකරන එකම තැන
ආධුනික සෙබළ බව
හැමගේ සිතට
දැනේවා එක් දිනක

සෙ/379164
ලා/කෝ ගුණතිලක ඩීපීජීපී
අණ හා පාලන කණ්ඩායම
ඔඩ්ඩුසුඩාන්

## සැබෑ මිනිසෙකු වන්නේ...

සැබෑ මිනිසෙකු වන්නේ
පෙළපත් නාමය හෝ
ඇඳුමට විතරක් නොව
හදවතින් නැගෙන
යහපත් සිතුවිලි තුළිනුයි
චරිතය තුළින්
ගෞරවය අගෞරවය
ලැබෙනවා සේම
මනුස්සකම ඇති
මිනිසෙකු බිහිවන්නේ
හදවතින් නැගෙන
යහපත් සිතුවිලි තුළිනුයි...

සෙ/කිපු04364
ලා/කෝ බංඩාර කේඑම්ජීඑච්
9 ශ්‍රීලංජාආබමු

## රිදුම් දෙන සාංකාව...

ඉවසන්න බැරිවුණාම තනිකම
රිදුම් දෙන්නේ නුඹත් ළඟ
නැති සාංකාව...
තදකරන් පපුවටම
උණුසුමින් සැනපෙන්න
හිත කොනිති ගසා
ඇඳුම්කන හදවතට
මේ හැඟුම්බර වැඩි
මඟබලන නෙත් අගට
ඇත්තමයි...
රිදුම් දෙන හදවතට
නුඹයි මගේ එකම ඔසුව...

සෙ/282134
කෝප්‍රල් මදුසංක ඩීජීඑන්
6 ශ්‍රීලංසංබ



# සිතුවිලි සාගරය....

## නව වසරට ආසිරි...

තිස් වසරක්ම පැවතුණු බිහිසුණු යුද්දේ
ජයගත් හෙයිනි ලක්මව අභිමන ලද්දේ
රණවිරුවන්ට නැගු ජය කාහළ සද්දේ
තෙරුවන් බෙලෙන් සෙත දේ නව අවුරුද්දේ

දාගැබ් වෙහෙර මහ වැව් පිළිසකර කොට
ඉටුකළ මෙහෙවරෙන් බැබළුණි සිහළ රට
සුබ නව වසරකට පා තැබූ දිනයෙ සිට
ජය මල් පිදේවා රණවිරු පිරිස හට

තද වැසි සුළං ජල ගැල්මට ගොදුරු වුණු
පිරිසක් මුදා ගන්නා මාවතම තැනූ
රණවිරු පිරිස හට මේ මවු බිමෙහි දිනූ
සෙත දේ නව වසර සොම්නස සතුට ඉනූ

කෝවිඩ් අඳුර දුරලන්නට ගත් වෙහෙස
මග සවියක් වුණා දැය යහපත පිණිස
ඉටුවී පැතුම් බැබලී රණවිරු පියස
ලද නව වසරෙ අත්වේවා කිතු යසස

කොස්කඳවල නන්දසේන වීරසිංහ

## විරුවන්...

දෙතුන් දිනයක් පුරා
ආකාශයෙන් වැටුණා
මහා රළු වරුසා
ගිනි පිනි පොදක් සේ

මා සිතට දැනුණා කිම
මහ මායාවන් මෙහි දුටු
සොඳුරු සිහිනයක් ලෙස
ඔබ මැවිය අයුරු

නොහැක මා අදහන්න
සිත් අහස පුරා
හෙලූ කරුවල මැදින්
සොඳුරු මැදියමෙහි
සිහිනයක් ලෙසින් හෝ
ඔබ යළිත් එනවාද

සෙ/277428
සංසෙ පීරිස් පීපීආර්
11 ශ්‍රීලංසංබ

## විරුවන්...

තුනුරුවන් සරණයි මගෙ රන් කඳ
ඔයාටයි පැටියටයි
මේ ලියන්නෙ කිලිනොච්චිය
හමුදා කඳවුරේ ඉඳලයි
ඈත තල්වැට මායිමෙන් වෙඩි හඬක
සේයාවක් ඇසෙයි
මොකක්දෝ මහ අමුතු හැඟීමක්
තුන් හිතේ ගැහි ගැහී තියෙයි...

හැමදාම රෑ අහසේ කෙලවර
තියෙනවා පොඩි තරු දෙකක්
හිනාවී මන් දෙසට බලනවා
චූටි දුවගෙ හැඩ අරන්
දෙකම්මුල් දිග ගලනා කඳුලැලි
පිසදමා හනිකට ඉතින්
බලනකොට මගෙ දුවගෙ ඒ තරුත්
හැංගී මටත් හොරෙන්...

නැවතීමේ තිත තියන්ට හිත ඉඩ
නොදුන්නත් වස්තුවේ
මරුවා ආවම පස්සෙ කියන්න බෑ කිසි වෙලේ
නාඩලා දුක ඉවසපන් අපේ කෙල්ල
වෙනුවෙන් රන් කඳේ
ගෙවෙන හැම රැයකදීම හීනෙන්
ඇවිත් යන්නම් නිදහසේ...

සෙ/480582
සැරයන් කරුණාරත්න පීකේජීපී
6 ගරෙ



# නොහැක්කක් නොමැත

## කමාන්ඩෝ විරුවන්ගේ අහිමානය...

හරිතවත් බිමෙන් සැදි සියල් සැපයෙන් සපිරි දෙරණේ හැඩගත් කමාන්ඩෝ රණවිරු සමරු අංගනය මැද නිමැ වූ ජල පොකුණ හා ඉන් අහසට නැගෙන දිය දහර මිනිස් වග හා ජලය අතර බැඳි නොනැසෙන සබැඳියාව හා මේ සමරු අංගනයේ පිවිතුරු බව සැලකරයි.

අප පොරණ හෙල පුතුන් ගලින් දැවයෙන් හා මඩින කල මහා විස්කම් හුරුකර ගනිමින් ඒ උරුමයන් හිමි සිරිලක් කමාන්ඩෝ බලමුළුවනට කොතැනක හෝ කුමක් වුව මැවිය හැකි බව කියනු වස් මෙහි සියලු පිය ගැට ගලින් නිමැවූ වගයි.



සිරිලක් දෙරණ, දියඹ හා ගුවන දිග්විජය කල මහ මෙහෙයුමේදී තුරු වැලින් ගහන හුදකලා වන පෙතෙහි දින ගණන් සැරිසරා ගත සවිය ගිලිහුනද අවසන සිත් බලය අවුලා නන්විද වූ රුදුරු සතුරු බල බිඳ දිනූ ජය උදෙසා දිවි කැප කල රණවිරු නාමයෙන් දැරූ සෙල් පවුරුය. ඒ මතින් ගලා හැලෙන ජල දහර උන් ආත්මයනට නිති සිසිල හා ජීවයක් සැදුමටය. ඒ විරුවන් හා බැඳි අතීත මතකයන් සිහිගන්වන්නටය.

විරු සමරු අංගනයෙන් ඉහළ, කමාන්ඩෝ විරුවන්ට උරුම වූ ඉතා අසීරු වූ ද කටුක වූ ද කුඩා කණ්ඩායම් රණකාමී බව තුළින් සතුරා විශ්ම කොටැ උන් නසා ලද ජයෙන් උදම්ව නැවතත් සතුරු බලයක් නැගේනම් උන්ද නසනු අටියෙන් නැගී සිටි විරු බලමුළුවය.

කිසි අයුරකින් සතුරු බලයට නොනැමී සිය කාර්යයෙහි වගකීම හා රණබිම විනය රැකුම වෙනුවෙන් තම දිවිය දෙවැනි කොට යුධ වදින්නට සපත කොටැ රණබිමට පිළිපන් සිටි විරු බලමුළුවේ.

නැගෙනහිර දෙස බලා බර අවි අතදරා තියුණු බැල්මෙන් සැරසී කමාන්ඩෝ විරුවාද උතුරු දෙස යොමු වූ තියුණු දෙනෙතින් රණබිමේ එල දරණ ප්‍රහාරක අවි සහ මිසයිල විදිනය අතැතිව සතුරා දකින වියරුවෙන් සිටින කමාන්ඩෝ විරුවා ද පසුපසින් හිඳ නැගෙන සතුරු බල නසන්නට සැරසී ඔහු බොමු විදිනය අතැතිව සිටින කමාන්ඩෝ විරුවා ද සමගින් ලැබූ ජයෙන් ඔදවත් වූ සිතින් කමාන්ඩෝ ධජය ඉහල එසවූ විරුවා හා එක්ව රළු පරළු වූ රණබිමෙන් නැගී සිට කියන්නේ, කටුක යුධ බිම සිටියද සියලු දුක් ඉවසමින් සමගියෙන් නැගුනු විට කල "නොහැක්කක් නොමැත" යන වගයි.

*සටහන*
*රෙජිමේන්තු මධ්‍යස්ථානය*
*කමාන්ඩෝ රෙජිමේන්තුව*





# තුරුලිය රැකුමට උරදෙමින්...

306 සී 1 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සිංහ සාමාජිකයින් සමග සම්බන්ධතාවයෙන් යුතුව 8 වන විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් "තුරු මිතුරු නව රටක්" වනවගා ව්‍යාපෘතියට සමගාමීව මන්නාරම් දිස්ත්‍රික්කයේ සිනාත්නගර්හි පර්චස් 160 ක භූමි ප්‍රමාණයක පැළ රෝපණය කිරීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 03 වන දින සිදුකරන ලදී. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඒඅයිජේ බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ සහභාගි වූ අතර, 543 වන පාබල බලසේනාධිපති ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින් සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සිංහ සාමාජිකයින් පිරිසක් ද ඊට එක්වූහ.

# අභිමානවත් සංවත්සර දිනය සමරමින්...





ඉංජිනේරු සේවා බලකායේ 71 වන සංවත්සරය ඉකුත් ජනවාරි 10 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු වැඩසටහන් මාලාවක් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්වූයේ අධ්‍යක්ෂ ජෙනරාල් ඉංජිනේරු සේවා සහ බලකාධිපති ඉසේබ මේජර් ජෙනරාල් ආර් ගනේගොඩ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙනි. කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, රණවිරු ස්මාරකය අභියස මියගිය රණවිරුවන් වෙත පුෂ්පෝපහාර දැක්වීම යන වැඩසටහන් එහිදී සිදුකෙරිණ. තවද සියලු නිල තේ පැන් සංග්‍රහයකටද එක්වූ බලකාධිපති විසින් සියලු නිලයින් අමතන්නටද අමතක නොකළේය.

# සංචාරයක සොඳුරු මතක...





විදේශ ආරක්ෂක නිලධාරීන් පිරිසක් පසුගියදා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) බලප්‍රදේශයේ නිරීක්ෂණ සංචාරයක නිරත වූහ. එම පිරිස මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති වෙනුවෙන් බ්‍රිගේඩියර් (පාලන/හකාස) බ්‍රිගේඩියර් ටීඑම්ජීජීඑස් තෙන්නකෝන් ආර්ඩබ්ලිව්පී විසින් උණුසුම් අයුරින් පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් කේආර්කේකේටී බංඩාර ආර්එස්පී යූඑස්පී, ඇතුළු එම මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක්ද පැවැත්වුණු අතර, එම හමුව අවසානයේ සමරු තිළිණ හුවමාරුවක්ද සිදුවිය.





# "හයිඩ්‍රංචියා මල් වගාව" පිළිබඳ දේශනයක්...

ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එච්පීඑන්කේ ජයපතිරණ ආර්එස්පී ගේ මඟපෙන්වීම මත හේලීස් ඇග්‍රිකල්චර් පුද්ගලික සමාගම සමඟ සම්බන්ධීකරණයෙන් ඉකුත් ජනවාරි 19 වන දින "හයිඩ්‍රංචියා මල් වගාව" හඳුන්වාදීමේ වැඩසටහනක් එම සුහසාධක වෙළඳසැල් පරිශ්‍රයේදී පැවැත්විණ.

යුද්ධ හමුදාධිපති තුමන් සහ යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය පසුගිය දිනක දියතලාවෙහි නවතමයෙන් ඉදිකරමින් පවතින යුද්ධ හමුදා සුහසාධක වෙළඳසැල් පරිශ්‍රයෙහි සංචාරයක නිරත වූ අවස්ථාවක එම පරිශ්‍රය තුළ "හයිඩ්‍රංචියා මල් වගාව" ආරම්භ කිරීම පිණිස ලබාදුන් උපදෙස් මත මෙම කටයුත්ත ඇරඹිණ.





# "යුද සාහිත්‍යය" දේශනයක්...
## කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේදී...

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන පාඨමාලා අංක 38 ට අයත් කෙඩෙට් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා වූ යුද සාහිත්‍යය දේශනයක් 2021 ජනවාරි 23 වන දින එම විද්‍යාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. පාඨමාලාව හදාරන සිසු සිසුවියන්, 300 කට ආසන්න පිරිසක් සහභාගි වූ එම දේශනයට ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන පීඨයේ පීඨාධිපති කර්නල් ඉනෝජ් හේරත් ආර්එස්පී යූඑස්පී ඇතුළු පරිපාලන නිලධාරීන් රැසක් එක්වූහ.

යුද්ධ හමුදා අංශ, ආයතන තුළ හා සිවිල් සමාජය අතර යුද සාහිත්‍යය ප්‍රචලිත කිරීම වෙනුවෙන් යුද හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීපව්‍යාප්තව සිදුකෙරෙන දේශන මාලාවේ තවත් අදියරක් ලෙස පැවති එම දේශනය මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරියෙහි නියුතු මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් මෙහෙයවන ලදී. තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට සෘජු ලෙස දායක වූ විරුවන් අගයමින් එකී මතක හා අත්දැකීම් පිළිබඳ නව පරපුර දැනුවත් කරමින් යුද සාහිත්‍යයක් මෙරට තුළ බිහිකිරීම මෙම වැඩසටහනෙහි අරමුණයි.

# 11 ශ්‍රීලංසිරෙ




ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ජේඑම්යූ ජයසිංහ ඉකුත් ජනවාරි 06 වන දින 11(සේව) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කඳවුරු සංචාරයක් සිදුකරන ලදී. එහිදී සේනාවිධායක විසින් එම ඒකකයෙහි සියලු භටපිරිස් අමතන ලද අතර, සංචාරය සිහිවීම වස් ඔහු වෙත සමරු තිළිණයක්ද පිළිගැන්විණ.

# මාහැඟි පරිත්‍යාගයක්...



58 වන පාබල සේනාංකයේ භෝජනාගාර සේවක මහතෙකු ලෙස රාජකාරී කරනු ලබන 14පීඑස් 18395 එන්වී අනුර යන අයගේ නිවසක් ඉදිකිරීම සඳහා රුපියල් 50,000.00 ක ආධාර මුදලක් පිරිනැමිණ. අධ්‍යක්ෂක ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් ඒපීඅයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී යූඑස්පී වෙත පරිත්‍යාගශීලියෙකු වෙතින් ලබාදී තිබූ අදාළ මුදල එම භෝජනාගාර සේවක මහතා වෙත පිරිනැමීම 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ඉකුත් ජනවාරි 20 වන දින සිදුකරන ලදී.

# සංවත්සර දිනයට අරුතක්...



15(සේව) ගජබා රෙජිමේන්තුවේ 24 වන සංවත්සරය ඉකුත් ජනවාරි 23 වන දිනට යෙදී තිබුණි. එයට සමගාමීව ඉකුත් ජනවාරි 15 වන දින යාපනය ශික්ෂණ රෝහලෙහි ලේ බැංකුවේ වෛද්‍ය කණ්ඩායමකගේ දායකත්වයෙන් යුතුව ඒකක මූලස්ථානයේදී ලේ දන්දීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන ඒකකයේ යුද්ධයෙන් හා විවිධ හේතූන් මත මියගිය රණවිරුවන්ට පින් අනුමෝදන් කිරීම වස් සිදුකරන ලද අතර, ඒ සඳහා ඒකකයෙහි හා ඒකකය අයත් බලප්‍රදේශය තුළ පිහිටි පාබල බලසේනාංක සහ ඒකකයන්හි නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් ඇතුළු 56 දෙනෙකු පමණ රුධිරය පරිත්‍යාග කරන ලදී.



# යෝගා ව්‍යායාමයේ ආශ්චර්යය හා සුව දිවිය...

යෝගා යනු ආශ්චර්යවත් විද්‍යාවකි. ජීවාත්මය පරමාත්මය සමග එකතුවීමත් හා ශාරීරික මානසික ආධ්‍යාත්මික යන තුන් කල්හි බැඳීමක් ඇති කිරීම යෝගා යනුවෙන් නිර්වචනය කළ හැක. මෙය මිනිසාගේ පැවැත්මට යහපත් ප්‍රතිඵල ගෙන දෙන අතර මිනිසාගේ මෙලොව පරලොව සුවය පිණිස හේතු වන ක්‍රියාදාමයකි.

යෝගා යන්නෙහි මුඛ්‍ය අදහස නම් ''යහපතක්ම වේවා'' යන්නයි. ඉන් අදහස් කරනුයේ මිනිසාගේ කායික හා මානසික ආධ්‍යාත්මික සංවර්ධනයේ ධාරාවක් බවය. වර්තමාන ලෝකයේ සෞඛ්‍ය යන්නෙන් අදහස් කරනුයේ ශාරීරික, මානසික නීරෝගී බවයි. නූතන ජීවන ක්‍රියාවලිය අපට යෝජනා කරන්නේ කායික සුවතාවයයි. (FITNESS) මෙමගින් ප්‍රතිඵල ලබාගත හැක්කේ බාහිර ශරීරයට පමණි. එහෙත් මෙම යෝගා ව්‍යායාම් ක්‍රම මගින් ශාරීරික මානසික අධ්‍යාත්මික යන තුන් පැත්තෙන්ම නිරෝගීභාවය හා සෞඛ්‍යමත් සංවර්ධනයක් ඇති කිරීම විශේෂත්වයකි. යෝගා අභ්‍යාස තුළින් ශරීරයේ අභ්‍යන්තර ඉන්ද්‍රියන් වූ හෘදය, අක්මාව, පෙනහළු, වකුගඩු, ආහාර ජීර්ණ පද්ධතිය, අස්ථි පද්ධතිය හා ස්නායු පද්ධතියට ව්‍යායාම් හා ශක්තිමත් සම්බාහනයක් සිදුවීම තුළින් ශාරීරිකව නිරෝගී පුද්ගලයෙකු බවටත් බෝනොවන රෝග වූ කොලෙස්ටරෝල්, දියවැඩියාව, අධි රුධිර පීඩනය, අව රුධිර පීඩනය, ආතරයිටීස්, වැනි රෝග හා පිළිකා රෝගයන් ගෙන්ද වැළකීමට හැකිවීම මෙහි ඇති විශ්මයජනක වූ සත්‍යයකි.


යෝගා තුළ ඇති භාවනා ක්‍රම මගින් මානසික සංයමයක් හා පාලනයක් ද යහපත් සුබවාදී වූ මානසිකත්වයක් ද ඇති මිනිසෙකු නිර්මාණය වන අතර, එය තුළින් ආධ්‍යාත්මික සුවයකට ලඟා වූ ජීවිතයක් නිර්මාණය වන්නේ නිරායාසයෙනි.

වර්තමාන ලෝකයේ යෝගා ක්‍රම ඉතා ජනප්‍රියව ඇත. ඇතැම් රටවල රෝග සුවකිරීම සඳහා ද රෝහල් වල වෛද්‍යවරු මෙම යෝගා විද්‍යාව අනුගමනය කරයි.

මනා බලසම්පන්න අශ්චර්යමත් විද්‍යාවක් වූ මෙමගින් කළහැකි භෞතික ක්‍රියාකාරකම් ද බොහෝය. සමහරක්

> "වර්තමාන ලෝකයේ යෝගා ක්‍රම ඉතා ජනප්‍රියව ඇත. ඇතැම් රටවල රෝග සුවකිරීම සඳහා ද රෝහල් වල වෛද්‍යවරු මෙම යෝගා විද්‍යාව අනුගමනය කරයි. යෝගා තුල ඇති භාවනා ක්‍රම මගින් මානසික සංයමයක් හා පාලනයක් ද යහපත් සුභවාදී වූ මානසිකත්වයක් ද ඇති මිනිසෙකු නිර්මාණය වන අතර, එය තුළින් ආධ්‍යාත්මික සුවයකට ලඟා වූ ජීවිතයක් නිර්මාණය වන්නේ නිරායාසයෙනි."

ක්‍රියාකාරකම් දෘශ්‍යමාන වන අතර, සමහර ක්‍රියාකාරකම් පියවි ඇසට හසුනොවන ආකාරයෙන් ක්‍රියාත්මක වෙයි. මින් සමහරක් විද්‍යාත්මක උපකරණ වලට හසුකර ගත හැකි වුවත් සියල්ල එසේ කළ හැකි නොවේ. යෝගා විද්‍යාව තේරුම් ගැනීමට නම් එහි ගැඹුරු පතුලටම කිමිදිය යුතුය. මතුපිට පීනා සත්‍ය වූ සුවය සෙවීම කළ නොහැක. එහෙයින් මෙම භාවනාත්මක ව්‍යායාම් ක්‍රමය තුළින් මිනිසාගේ ශාරීරික මානසික නිරෝගීමත්බව හේතුවෙන් අධ්‍යාත්මික සුවයට ළංවන මාවතක් ලෙස මෙම බලසම්පන්න ආශ්චර්යමත් විද්‍යාව හේතුවනවා නොඅනුමානය.



සටහන :
සෙ/751808 ඔහි 11 වික්‍රමනායක ඩබ්ලිව්පීඑච්
(යෝගා ඩිප්ලෝමා ශ්‍රී ලංකා/ඉන්දියා)
1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව

**වෘත්තීය දිවියේ තේජවත් කඩඉම් පසුකොට
සුබ මොහොතින් නව තනතුරු ලද
ඔබ සියලු දෙනාට දිරිය, විරිය, ජයවර්ධනය ලැබේවායි "රණවිරුවා" දී
මෙසේ සුබ පතුම් එක්කරයි.**



උපකරණ මාස්ටර් ජෙනරාල්
ශාඛාවේ උපකරණ මාස්ටර්
ජෙනරාල් ලෙස
මේජර් ජෙනරාල්
ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී එන්ඩියූ
**2021 ජනවාරි මස 19 දින සිට**



ආරක්ෂක සේනා
මූලස්ථානය(වන්නි)
ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
ඩීඑම්එච්ඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී
**2021 ජනවාරි මස 16 දින සිට**



66 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
ඩීඑම්එම් දිසානායක ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩියූ අයිජී
**2021 ජනවාරි මස 16 දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ
**2021 ජනවාරි මස 19 දින සිට**



22 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී එන්ඩියූ
**2021 ජනවාරි මස 18 දින සිට**



12 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
ආර්ඒඩීපී රණවක ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩීසී
**2021 ජනවාරි මස 20 දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ
නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස
මේජර් ජෙනරාල්
අඩිසිඩබ්ලිව් මාදොල
**2021 ජනවාරි මස 14 දින සිට**



විධායක ජෙනරාල් ශාඛාවේ
විධායක ජෙනරාල් ලෙස
මේජර් ජෙනරාල්
ඩබ්ලිව්ආර්පීඑස්එස් වනසිංහ
ආර්එස්පී යූඑස්පී එන්ඩියූ
**2021 ජනවාරි මස 19 දින සිට**



64 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
එම්පී කරුණාරත්න අයිජී
**2021 ජනවාරි මස 18 දින සිට**



ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික
ඉංජිනේරු බළකායේ කර්නල්
සේනාවිධායක ලෙස
බ්‍රිගේඩියර්
එස්පීඒඅයිඑම්පී සමරකෝන්
එච්ඩීඑම්සී එල්එස්සී
**2021 ජනවාරි මස 12 දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ
මාණ්ඩලික ප්‍රධානී ලෙස
මේජර් ජෙනරාල්
ඩබ්ලිව්ඩබ්ලිව්එච්ආර්ආර් බංඩාර
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ
2021 ජනවාරි මස 18 දින සිට



ශ්‍රී ලංකා සංඥා බළකායේ
රෙජිමේන්තු අධිපති ලෙස
මේජර් ජෙනරාල්
පීඑල්ජේ පීරිස් එන්ඩීයූ
2021 ජනවාරි මස 18 දින සිට



62 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
ඩීඑම්කේඩීබී පුස්ඇල්ල ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී
2021 ජනවාරි මස 18 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය(කිලිනොච්චිය)
බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික ලෙස
බ්‍රිගේඩියර්
එල්ඩීඑස්එස් ලියනගේ ආර්එස්පී
යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී
2021 ජනවාරි මස 18 දින සිට



ශ්‍රී ලංකා පාබල හමුදාවේ
රෙජිමේන්තු අධිපති ලෙස
මේජර් ජෙනරාල්
කේඩබ්ලිව්ආර් ද ආබෘ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
පීඑස්සී එච්ඩීඑම්සී
2020 දෙසැම්බර් මස 30 දින සිට



ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්)
ආඥාපති ලෙස
මේජර් ජෙනරාල්
ආර් ගනේගොඩ පීඑස්සී
2021 ජනවාරි මස 19 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි)
බ්‍රිගේඩියර් (ප්‍රමාණි) ලෙස
බ්‍රිගේඩියර්
කේපීඑම්එස් ප්‍රනාන්දු
2021 ජනවාරි මස 18 දින සිට



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක
බලඇණියේ
රෙජිමේන්තු අධිපති ලෙස
මේජර් ජෙනරාල්
එන්ආර් ලමාහේවගේ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ
2021 ජනවාරි මස 15 දින සිට



කමාන්ඩෝ රෙජිමේන්තුවේ
රෙජිමේන්තු අධිපති ලෙස
මේජර් ජෙනරාල්
ආර්පීඩීයූ රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී
2021 ජනවාරි මස 18 දින සිට



ප්‍රධාන මාණ්ඩලික ශාඛාවේ
අධ්‍යක්ෂක ජෙනරාල්
ප්‍රධාන මාණ්ඩලික ලෙස
මේජර් ජෙනරාල්
එම්ඒඩී ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී
යූඑස්පී
2021 ජනවාරි මස 18 දින සිට

වෘත්තීය දිවියේ තේජවත් කඩඉම් පසුකොට
සුබ මොහොතින් නව තනතුරු ලැබූ
ඔබ සියලු දෙනාට දිරිය, විරිය, ජයවර්ණය ලැබේවායි "රණවිරුවා" දී
මෙසේ සුබ පැතුම් එක්කරයි.



541 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
කේඩීඑච්එල් සමරදිවාකර
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී
2021 ජනවාරි මස 20 දින සිට



ඉංජිනේරු සේවා බලකායේ
මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස
කර්නල්
එස්එන් කිතුල්ගොඩ යූඑස්පී
2021 ජනවාරි මස 13 දින සිට



61 වන පාබල සේනාංකයේ
කර්නල් සම්බන්ධීකරණ
(සෙවි කටයුතු) ලෙස
කර්නල්
ඩීඑස් රණසිංහ කේඑස්පී
2021 ජනවාරි මස 16 දින සිට



ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ
අධ්‍යක්ෂ ලෙස
බ්‍රිගේඩියර්
කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී
යූඑස්පී පීඑස්සී
2021 ජනවාරි 18 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය(යාපනය)
කර්නල් (ප්‍රමානි) ලෙස
කර්නල්
එම්ඩීඑස් මුණසිංහ ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී පීඑස්සී
2021 ජනවාරි මස 01 දින සිට



6 වන බලඇණිය ශ්‍රී ලංකා
පාබල හමුදාවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
විජේ දේවප්‍රිය ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී පීඑස්සී
2021 ජනවාරි මස 18 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය(බටහිර)
බ්‍රිගේඩියර්(ප්‍රමානි) ලෙස
බ්‍රිගේඩියර්
ආර්ඩබ්ලිව් පොත්තම්පෙරුම
ආර්එස්පී පීඑස්සී
2021 ජනවාරි මස 15 දින සිට



653 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
පීඑස් ෆොන්සේකා යූඑස්පී පීඑස්සී
2021 ජනවාරි මස 13 දින සිට



6 වන බලඇණිය ගජබා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
ලුතිනන් කර්නල්
එච්පීඒ සේනාරත්න ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී
2021 ජනවාරි මස 06 දින සිට



6(සෙවි) ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
ඩබ්ලිව්පීඑස් ගමගේ
2020 නොවැම්බර් මස 26 දින සිට



ආරක්ෂක සේනා
මූලස්ථානය(යාපනය)
බ්‍රිගේඩියර් (ප්‍රමාණි) ලෙස
බ්‍රිගේඩියර්
එම්කේයූපී ගුණරත්න ආර්එස්පී
එන්ඩීයූ පීඑස්සී ඇඩීපී
2021 ජනවාරි මස 15 දින සිට



III වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
ඩීඑම්ආර්බී රත්නායක
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
2021 ජනවාරි මස 15 දින සිට



523 පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
එස්බීඩබ්ලිව්එම්එන් සමරදිවාකර
ආර්එස්පී යූඑස්පී
2021 ජනවාරි මස 14 දින සිට



11 වන ශ්‍රී ලංකා සිංහ
රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි
ලෙස
මේජර්
එම්ඩබ්ලිව්එම් උදයකුමාර
2020 මැයි මස 20 දින සිට



මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස
බ්‍රිගේඩියර්
පීඩබ්ලිව්ජී සෙනෙවිරත්න
යූඑස්පී පීඑස්සී
2021 ජනවාරි මස 15 දින සිට



12 වන පාබල සේනාංකයේ
කර්නල් (ප්‍රමාණි) ලෙස
කර්නල්
එස්ඇයිපී විදානගමගේ ආර්එස්පී
ඇඩීපී
2021 ජනවාරි මස 14 දින සිට



23 වන බලඇණිය ශ්‍රී ලංකා
සිංහ රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරි ලෙස
මේජර්
එම්ඒඩබ්ලිව් මුණසිංහ
2021 ජනවාරි මස 21 දින සිට



144 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
බ්‍රිගේඩියර්
එම්ටීඅයි මහලේකම්
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී පීඑස්සී
2021 ජනවාරි මස 15 දින සිට



232 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
එම්ඩබ්ලිව්ඊආර්සී විජේසූරිය
ආර්එස්පී යූඑස්පී
2021 ජනවාරි මස 21 දින සිට



511 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
පීඑන්ජේඑස් ප්‍රනාන්දු යූඑස්පී
2021 ජනවාරි මස 14 දින සිට



## ඉංග්‍රීසි පාඩම...

කසුන් ඉස්කෝලෙ ඉංග්‍රීසි පීරියඩ් එක පටන් ගන්නකොටම ටීචර්ට වැන්දලු...

**ටීචර්** - අන්න දැක්කද ළමයි... කසුන් කරේ කොච්චර හොඳ වැඩක්ද කියල...

**කසුන්** - අනේ මංද ටීචර්... අපේ තාත්ත තමා ඔහොම කරන්ඩ කිව්වේ...

**ටීචර්** - මොකක්ද පුතාගෙ තාත්ත කිව්වේ...

**කසුන්** - නිදාගන්න කලින් වැඩිහිටියන්ට වඳින්න කියල...




## චිත්‍රපට බැලීම...

**සෝමදාස** - බලනවකො සුමනෙ... දැන් එන සිංහල චිත්‍රපටි එකක්වත් නැහැනෙ තමන්ගෙ පවුලත් එක්ක එකට ඉඳගෙන බලන්ඩ පුළුවන් ඒව...

**සුමනසිරි** - ඒකනං ඇත්ත බං... මම ඒකනෙ අපේ ගෙදර අය එක්ක නැතුව වෙන පවුලක් එක්ක චිත්‍රපටි බලන්ඩ යන්නෙ...



## ඩිලිවරි...

**සුනිල්** - මල්ලි මට පීසා එකක් දෙන්නකො...

**අවන්හල් හිමිකරු** - දැන් කන්නද අරන් යන්නද මහත්තයා...?

**සුනිල්** - ඔයාල ඩිලිවරි කරනව නේද...? ඕක මගෙ ගෙදරට අරන් යන්න...

**අවන්හල් හිමිකරු** - ඩිලිවරි කරන්ඩ නම් පුළුවන් සර්... ඒත් සර් මෙතන ඉද්දි මොකටද ඩිලිවරි කරන්නෙ...? සර්ට පුළුවන්නෙ මේක අරගෙන යන්ඩ...



**සුනිල්** - ඉතිං ඔයා මේක අපේ ගෙදරට අරන් යනගමන් මාවත් ගෙදරට බස්සවන්ඩ... ඉවරයිනෙ වැඩේ...

## සොයා ගැනීම...

**ටීචර්** - ළමයි... ඔක්සිජන් කියන්නෙ හුස්ම ගන්නයි ජීවත් වෙන්නයි වැදගත්ම දෙයක්... මේ පිළිබඳව සොයාගත්තේ 1773 දී...

**අමාලි** - හානේ ටීචර්.... වෙලාවට මං 1733 ට පස්සෙ ඉපදුනේ... නැත්තං මට ඒක නැතුව මැරෙන්න වෙන්නෙ...



## ඒකයි හේතුව...

**විනිශ්චයකරු** - පසුගිය අවුරුදු දහය තිස්සෙම යුෂ්මතා මේ අධිකරණයේ පෙනීසිටිය මට මතකයි...

**විත්තිකරු** - එහෙමයි ස්වාමීනි... පසුගිය අවුරුදු දහය තිස්සෙම තමුන්නාන්සෙත් මේ උසාවියෙම හිටිය නිසා වෙන්න ඇති...






# Vision...

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Would it be correct to say that

යම් කිසි කරුණක් පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමේදී "මෙහෙම කිව්වොත් හරිද මන්දා මෙසේ ප්‍රකාශ කළාට කමක් නැද්ද" යනුවෙන් අදහස් ප්‍රකාශ කිරීමේදී මෙම වාක්‍යය රටාව භාවිතා වේ. එහිදී ඉතා විනීත ආකාරයෙන් මනා සංයමයකින් යුක්තව අදහසක් ප්‍රකාශ කිරීමට භාවිතා වන බස් වහරක් ලෙස මෙය හඳුන්වා දිය හැක.

**Would it be correct to say that+ Clause.**
වුඩ් ඉට් බී කරෙක්ට් ටු සේ දැට් + ක්ලෝස්
මෙහෙම කිව්වොත් හරිද මන්දා + වාක්‍යය අංශයක්/කාණ්ඩයක්.

***Ex*** / උදා :-

1. Would it be correct to say that you are fat now.
   වුඩ් ඉට් බී කරෙක්ට් ටු සේ දැට් යූ ආ ෆැට් නව්.
   මෙහෙම කිව්වොත් හරිද මන්දා ඔයා දැන් මහතයි.

2. Would it be correct to say that you are talkative.
   වුඩ් ඉට් බී කරෙක්ට් ටු සේ දැට් යූ ආ ටෝකටිව්.
   මෙහෙම කිව්වොත් හරිද මන්දා ඔයා කථකාරයි.

3. Would it be correct to say that I like you.
   වුඩ් ඉට් බී කරෙක්ට් ටු සේ දැට් අයි ලයික් යූ.
   මෙසේ කීවට හරිද මන්දා මම ඔයාට කැමතියි.

4. Would it be correct to say that you are very proud.
   වුඩ් ඉට් බී කරෙක්ට් ටු සේ දැට් යූ ආ වෙරි ප්‍රවුඩ්.
   මෙහෙ කිව්වොත් හරිද මන්දා ඔයා හරි ආඩම්බරයි.

5. Would it be correct to say that your girlfriend is not so good.
   වුඩ් ඉට් බී කරෙක්ට් ටු සේ දැට් යුවර් ගර්ල් ෆ්‍රෙන්ඩ් ඊස් නොට් සෝ ගුඩ්.
   මෙහෙ කිව්වොත් හරිද මන්දා ඔයාගෙ ගැහැණු ළමයා හොඳ නෑ.

***Nota Bene*** / සැ.යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී පහත කරුණු පිළිබඳව අධ්‍යනය කරන්න.

- **Would it be correct to say that** :- "මෙසේ කීවොත් හරිද මන්දා, මෙහෙම කීවොතින් හරිද මන්දා" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම වාක්‍යය කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යවල භාවිතා වේ.

- **Clause** :- කර්ම කාරක සහ කර්තෘ කාරක වාක්‍යයන් භාවිතා කළ හැකිය.

Analysis of the sentence formation
වාක්‍යය රචනාවෙහි සැකැස්ම විශ්ලේෂණය.

Would it be correct to say that+ Clause.
වුඩ් ඉට් බී කරෙක්ට් ටු සේ දැට් + ක්ලෝස්
මෙහෙම කිව්වොත් හරිද මන්දා + වාක්‍යය අංශයක්/කාණ්ඩයක්.

Would it be correct to say that you are fat now.
වුඩ් ඉට් බී කරෙක්ට් ටු සේ දැට් යූ ආ ෆැට් නව්.
මෙහෙම කිව්වොත් හරිද මන්දා ඔයා දැන් මහතයි.

ප්‍රායෝගික අභ්‍යාස සඳහා වාක්‍ය නිර්මාණය කර වාක්‍ය රචනාවෙහි භාවිතය මැනවින් අවබෝධකර ගනිමු.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. නවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලසංබ
සංඥා පුහුණු පාසල - බුවැලිකඩ
www.englishvision.lk







# සංචාරයක සටහන්...

පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් පීඩීජේ සේනාධීර යූඑස්පී ඉකුත් ජනවාරි 19 සහ 20 යන දෙදින තුළ එම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන අභිමංසල 1 හා 3 සුවසහන නිකේතනයන්හි සංචාරයක නිරතවිය. එහිදී එම මධ්‍යස්ථානවල සියලු රණශූරයින්, කාර්ය මණ්ඩලයේ නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන්ගේ රාජකාරීන් මෙන්ම ඔවුන්ගේ පුද්ගලික ගැටළු පිළිබඳ ඔහුගේ අවධානයට බඳුන්විය. අනතුරුව හෙතෙම එම මධ්‍යස්ථානයෙහි ස්ථාපනය කර ඇති සෘජුකාරක හා විකලාංග කාර්මිකාගාරය නිරීක්ෂණය කිරීමටද එක්විය. එම අවස්ථාවට සමගාමීව රණශූරයට පත්ව සුවසහන නිකේතනවල නේවාසික ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ මානසික ප්‍රවර්ධනය සඳහා ජේඒ ඉරේෂා සෙව්වන්දි ජයකොඩි යන මහත්මිය විසින් "මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම වළක්වා ගැනීම, ප්‍රතිකාර ක්‍රමවේද සහ නිවාරණය" පිළිබඳ දේශනයක් ද සිදුකරන ලදී.

---


රණවිරුවා

පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම

සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ

සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජීඑම් 11 ඉසේරෙ

සෙ/754676 ලාන්ස් කෝප්‍රල් ලක්තිලක ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

ගුත දිගුව

51445/51446

ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය






අධීක්ෂණය

බ්‍රිගේඩියර් ඊඑම්පීඩබ්ලිව් සෙනෙවිරත්න යූඑස්පී පීඑස්සී



උපදේශකත්වය

ලුතිනන් කර්නල් ඩීඑම්ඩබ්ලිව් දිසානායක ආර්ඩබ්ලිව්පී



ප්‍රධාන සංස්කාරක

මේජර් සුචිත චමින්ද එදිරිසිංහ ශ්‍රීලංකාපාබසේ



සහාය සංස්කාරක

කපිතාන් ආර්ඒ ගෙවිතාරණ ශ්‍රීලංකාසබ



# කොවිඩ් මැඩලන එන්නත රණවිරුවන්ට...

ඉන්දියානු රජය විසින් ශ්‍රී ලංකාව වෙත පරිත්‍යාග කරනු ලැබූ **Astra Zeneca Covidshield** එන්නත දිවයින පුරා කොවිඩ් 19 පැතිරීම වැළැක්වීම වෙනුවෙන් පෙරමුණේ සේවය කරන යුද්ධ හමුදා භටපිරිස් වෙත ප්‍රථමයෙන් ලබාදීමේ කටයුතු පසුගිය ජනවාරි 29 වන දින කොළඹ යුද්ධ හමුදා රෝහලේදී ආරම්භ කෙරිණ.

කොවිඩ් 19 ආසාදිතයින් ගේ ආශ්‍රිතයින් ගේ නිරෝධායන කටයුතු සහ ආසාදිතයින්ට ප්‍රතිකාර කිරීමේ කාර්යභාරයේ ප්‍රමුඛ කර්තව්‍යයක් ඉටුකිරීම සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් සක්‍රියව දායකවන හෙයින් ඔවුන් වෙත ප්‍රමුඛත්වයක් මත අදාළ එන්නත ලබාදීම දිවයින පුරා යුද්ධ හමුදා රෝහල් 15 ක් ඔස්සේ සිදුකරනු ලබයි. එහිදී පළමු එන්නත යුද්ධ හමුදා නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ කර්නල් එස්එන් සේමගේ යූඑස්පී වෙත ලබාදුන් අතර, පසුව යුද්ධ හමුදාවේ තවත් සාමාජිකයින් දෙපලක් වෙතද ලබාදෙනු ලැබිණි.

මෙම එන්නත් ලබාදීමේ සමාරම්භක අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාත්මක මධ්‍යස්ථාන ප්‍රධානී මෙන්ම යුද්ධ හමුදාධිපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ද එක්විය.





# ජීවක සුරතින් ජීවිත සුරකින මෙහෙයට තුති මල් මිටක්...





රජේ රටට එල්ලවෙන ඕනෑම ව්‍යසනයකදී, ආපදාවකදී පෙරමුණේ සිටින රණවිරුවන් බලකිරීමකින්, අණ කිරීමකින් තොරවම ඒ සඳහා මූලිකත්වය ගනු ලබයි. වර්ථමානයේ උද්ගතව තිබෙන කොවිඩ් ව්‍යසනය හමුවේ යුද්ධ හමුදා වෛද්‍ය බලකා සාමාජිකයින් සමස්ථ රටක් සුවපත් කරන දැවැන්ත භූමිකාවක නිරත වේ. මෙවර "රණවිරුවා" පසුකවරය වෙන් කෙරෙනුයේ එකී ජීවිත සුරකින ජීවක දෑත්වලට උපහාර පිණිසය.



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.